# කාර්ය සාධන වාර්තාව

# 2014


**සමාජ සේවා දෙපාර්තමේන්තුව**

**දෙවන මහල**

**සෙත්සිරිපාය - II අදියර**

**බත්තරමුල්ල**

| | |
|---|---|
| දුරකථන | : 0112187050 |
| ෆැක්ස් | : 0112186276 |
| ඊ - මේල් | : dirss@sltnet.lk |
| | dirssdss@gmail.com |
| වෙබ් අඩවිය | : www.socialservices.gov.lk |

# පටුන


| | | පිටුව |
|---|---|---|
| 1. | සමාජ සේවා අධ්‍යක්ෂතුමියගේ පණිවුඩය | 03 - 04 |
| 2. | සමාජ සේවා දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර, තේමාව හා වටිනාකම් අරමුණු හා ක්‍රියාකාරකම් | 05 - 07 |
| 3. | කාර්ය මණ්ඩලය හා සංවිධාන ව්‍යුහය | 08 - 10 |
| 4. | 1 වන පරිච්ඡේදය - මූල්‍ය ප්‍රගතිය | 11 - 14 |
| 5. | 2 වන පරිච්ඡේදය - ආබාධ සහිත වූවන් සඳහා වන සුභසාධන වැඩසටහන<br>ළමාමාර්ගෝපදේශනමධ්‍යස්ථානව්‍යාපෘතිය<br>දෘශ්‍යාබාධිතපුනරුත්ථාපනභාරඅරමුදල | 15 - 28 |
| 6. | 3 වන පරිච්ඡේදය - මතට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය හා සමාජ ගත කිරීමේව්‍යාපෘතිය | 29 - 30 |
| 7. | 4 වන පරිච්ඡේදය - විදේශ ආධාර ව්‍යාපෘතිය හා විශේෂ වැඩසටහන් | 31 - 32 |
| 8. | 5 වන පරිච්ඡේදය - ආබාධ සහිත පුද්ගලයින් සඳහා වනප්‍රජාමූලික අන්තර්කරණ සංවර්ධන ජාතික වැඩ සටහන - **C B I D** | 33 - 36 |
| 9. | 6 වනපරිච්ඡේදය - පුහුණුවැඩසටහන්හාපුහුණුපාඨමාලා | 37 - 38 |

## සමාජ සේවා අධ්‍යක්ෂතුමියගේ පණිවුඩය

ශ්‍රීමත් අයිවර් ජෙනිංග්ස් මහතාගේ මූලිකත්වයෙන්1944 පත් කරන ලද සමාජ සේවා කොමිෂන් සභාවේ නිර්දේශ මත1948 පෙබරවාරි 01 දින සමාජ සේවා දෙපාර්තමේන්තුව ස්ථාපනය කරන ලද අතර වත්මනෙහි සමාජ සේවා විෂයභාර අමාත්‍යාංශය යටතේ තම කාර්ය භාරය ඉටු කරනු ලබයි.

2013 වසරේ ජතික මට්ටමේ සිට බිම් මට්ටම දක්වා සහභාගීත්ව සංවර්ධන ප්‍රවේශය හරහා විෂය පථයට අයත් හඳුනාගනු ලැබූ විවිධ වැඩසටහන් වඩාත් සැලසුම් සහගතව පසු විපරම් සහිතව ඉටු කළ නිසා වාර්ෂික මූල්‍ය ප්‍රගතිය පුනරාවර්තන වියදම්වල99.42 % ක් ද ප්‍රාග්ධන වියදම්වල79.63 % ක් දක්වාද ළඟා කර ගැනීමට හැකියාව ලැබී ඇත. 2013 වසරේදී දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය සලකා බලමින් 2014 වර්ෂය සඳහා විශේෂ සංවර්ධන වැඩසටහන් යටතේ ආබාධිත ප්‍රජාව සඳහා වූ වෘත්තීය පුහුණු ආයතන නවීකරණය සඳහා මිලියන 100 ක ප්‍රතිපාදන ලැබුනු අතර එහි ප්‍රගතිය 76.55% කි. අනෙක් ප්‍රාග්ධන වැඩසටහන්වල ප්‍රගතිය 91.21 % ක් වී ඇත. වැඩසටහන් 03 ක් යටතේ දෙපාර්තමේන්තුව වෙත 2014 වර්ෂය සඳහා ප්‍රාග්ධන ප්‍රතිපාදන රු. මිලියන 126.615 ක් ද පුනරාවර්තන ප්‍රතිපාදන රු. මිලියන 328.233 ක් ද විය.

2013 වසරේ දෙපාර්තමේන්තුවේ කටයුතුවල සාර්ථකත්වය නිසාම 1990 සිට අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ ප්‍රජා මූලික පුනරුත්ථාපන වැඩසටහන (සී.බී.ආර්.ජාතික වැඩසටහන) දෙපාර්තමේන්තුවේ විෂය පථයට ඇතුළත් කරන ලදි. 2014 ජනවාරි 01 දින සිට 2014 දෙසැම්බර්31දින දක්වා උපායමාර්ගිකසැලැස්මටහාසංයුක්ත සැලැස්මට අනුකූලව හා දහස් පුබුදුව වැඩසටහනට සමගාමීව සකසා ගනු ලැබූ ක්‍රියාකාරකම් සහිත දින කැලැන්ඩරයක් සහිතව නිරන්තර ඇගයුම් මෙහෙයුම් ක්‍රියාවලියක් මගින් ක්‍රියාත්මක වීම මගින් අපේක්ෂිත මට්ටම75 % ක් පමණ ළඟා කර ගැනීමට දෙපාර්තමේන්තුවට හැකියාව ලැබී ඇත.

ඒකාබද්ධ ප්‍රවේශය තුළ රජය හා රාජ්‍ය නොවන සංවිධාන ආබාධ සහිත ප්‍රජාවසඳහා දීප ව්‍යාප්ත නර්තන හා සංගීත තරඟාවලියක් පැවැත්වීමට සංස්කෘතික දෙපාර්තමේන්තුවේ මූලිකත්වයෙන් එම දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන මත සිදුකිරීමට අපගේ සහයෝගය ලබා දීමට හැකිවිය.

සමාජ සේවා නිලධාරීන්, සමාජ සංවර්ධන සහකාරවරුන්, සංවර්ධන නිලධාරීන් 500 දෙනෙක් පුහුණු කිරීම සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් නායකත්ව, කුසලතා ඔප්නැංවීමටත් කණ්ඩායම් හැඟීම් ප්‍රවර්ධනය සඳහාත් තෙදින නේවාසික පුහුණුවකට රු. මිලියන 02 ක ප්‍රතිපාදන ලැබුණි.එම පුහුණුවත් සමඟ නිලධාරීන්ගේ සැඟවුනු දක්ෂතා ඔප් නැංවීම තුළින් ගොඩනැගුනු ජවයෙන් රාජකාරි කටයුතු කිරීම දක්නට ලැබුණි. ඒ අනුව 2014 වසරේදී ශක්තිමත් ශ්‍රම බලකායක් දෙපාර්තමේන්තුව තුළ ප්‍රතිස්ථාපනය කිරීමට හැකියාව ලැබුණි.

සොයුරු පාසල් මිත්‍රත්ව වැඩසටහන යටතේ මෙම වසරේද කොරියානු රජයේ අනුග්‍රහයෙන් (KOICA)නිලධාරීන් 15 දෙනෙකු කොරියාවේ අධ්‍යයන චාරිකාවක් ලබාදීමට අවස්ථාව ලැබුණු අතර එරට කණ්ඩායමක් ද සාර්ථක අත්දැකීම් හුවමාරුවක් සඳහා දෙපාර්තමේන්තුව යටතේ පවතින වෘත්තීය පුහුණු ආයතන නිරීක්ෂණට පැමිණියහ. එහිදී දෙපාර්තමේන්තුව යටතේ පවතින වෘත්තීය පුහුණු ආයතනවල සාර්ථකත්වය මත වෘත්තීය උපදේශකවරුන් දෙදෙනෙකු සඳහා මසක විශේෂ නේවාසික පුහුණුවක් කොරියානු රජය විසින් ලබාදෙන ලදි.

2013 වසරේමෙන් වෘත්තීය පුහුණු ආයතනවල ඉගෙනුම ලබන අභ්‍යාසලාභීන් දිස්ත්‍රික්, පළාත් හා ජාත්‍යන්තර මට්ටමෙන් නියමිත ජයග්‍රහණ ලබා ගැනීමද සිදුවිය. වෘත්තීය පුහුණු ආයතනවල පාඨමාලා ගණනාවක්ම පළමු වරට NVQසහතික පාඨමාලා බවට පත්කිරීමට හැකියාවද ලැබුණි.

2015 වසර සඳහා ප්‍රජා මූලික වූ ක්‍රියාකාරී සැලැස්මක් සැකසීමට ද හැකියාව ලැබුණු අතර 2013 වසරට වඩා 2014 භෞතික වශයෙන් ඉහළ ප්‍රගතියක් ලබා දී තිබුණු අතර විශේෂයෙන්ම නිලධාරීන්ගේ දැඩි ආකල්ප සංවර්ධනයතුළ, අධ්‍යාත්මික සංවර්ධනය තුළ, තවදුරටත් ඉහළ ඉලක්ක ලබාගැනීම සඳහා අවශ්‍ය මානසික ශක්තිය ගොඩනැගීමට හැකිවූ වසරක් ලෙසද 2014 වසර හැඳින්විය හැකිය. දෙපාර්තමේන්තුවේ සාර්ථක ඉලක්ක ජයග්‍රහණය කර ගැනීම පාලන විෂයෙන් බැහැර වූ විවිධ ගැටළුකාරී තත්ත්වයන් මත සිදු වුවත් සියලු සාර්ථකත්වයන් සඳහා හිටපු ලේකම් එම්ල්ඩා සුකුමාර් මහත්මිය ඇතුළු සමාජ සේවා අමාත්‍යාංශයේ සියලුම ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරීන් හා සෙසු නිලධාරීන් සිහිපත් කරන්නේ සෙනෙහසිනි. එමෙන්ම සැලසුම් සහගත ඉලක්ක ළගා කර ගැනීම සඳහා සමාජ සේවා දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්ය මණ්ඩලය කරන ලද ඇප කැප වීම සිහිපත් කරන්නේ හද පිරි ආදරයෙන් හා භක්තියෙනි. එමෙන්ම සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්, අතිරේක ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන්, සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන් මෙම දෙපාර්තමේන්තුවේ කටයුතු සඳහා මුදල් අමාත්‍යාංශයේ ලේකම් ඇතුළු අදාළ කාර්ය මණ්ඩලය ලබාදුන් සහයෝගයද ඉතා අගයකොට සළකමි. එමෙන්ම පළාත් සමාජ සේවා අධ්‍යක්ෂවරුන් හා ඔවුන් යටතේ සේවය කරන සමාජ සේවා විෂයභාර නිලධාරීන්ද විශේෂයෙන්ම අප දෙපාර්තමේන්තුවේ නිලධාරීන් අනුයුක්ත කර නොමැති ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවය කරන පළාත් සමාජ සේවා විෂයභාර නිලධාරීන්ද කිසිසේත් අමතක කළ නොහැකිය.

එමෙන්ම ප්‍රාදේශීය මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා කටයුතු කිරීමේදී විවිධ රාජ්‍ය නොවන සංවිධාන වැඩසටහන් සඳහා ලබාදෙන විවිධ අනුග්‍රහ හා පහසුකම් මුළු දිවයිනම ඒකාබද්ධව සැළකූවිට ඒකාබද්ධ අරමුලින් වාර්ෂිකව ලබාදෙන ප්‍රතිපාදන ප්‍රමාණයටත් වඩා වැඩිය. එකී අනුග්‍රහ ලබාදුන් සැම කෙනෙකුටම සැම ආයතනයකටම ස්තුතිවන්ත වෙමි.

2014 වසරේ අපේක්ෂිත ඉලක්ක ළඟා කරගනිමින් ලැබූ ජයග්‍රහණ 2015 වසර වඩා සාර්ථක කර ගැනීම සඳහා හේතුපාදක වනු නොඅනුමානය.

බොහෝ දෙනෙකුගේ මැදිහත්වීම් තුළ 2014 වසරේ සමාජ සේවා දෙපාර්තමේන්තුවට නව නිර්මාණාත්මක ප්‍රවේශයක් තුළ පාදක වැඩසටහන් ගණනාවක් සාර්ථකව නිම කළ වසරක් ලෙස සහේතුකව සඳහන් කළ හැකිය. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මහජනතාවගේ වැටුප් ලබන සේවකයකු ලෙස මා හට ඇත්තේ ඉමහත් සතුටකි.ඊටත් වඩා 2015 වසරේදී සතුට සපිරි අභිමානනීය සැබෑ මිනිසුන්ගෙන් පිරි පින්බර දේශයක් එක්ව ගොඩනැගීම සඳහා මානව සංවර්ධනයේ පෙර ගමන්කරු වීමේ අපේක්ෂාවක් හා අභිලාෂයකි. ඒ සඳහා සියලුම පාර්ශවයන්ගේ හෘදයාංගම මැදිහත්වීම හා සහයෝගය උපරිමයෙන්ම ලැබෙනු ඇතැයි අපේක්ෂා කරමි.

හිතායු ! සුඛායු ! දීඝායු !

අනූෂා ගෝකුළ ප්‍රනාන්දු
සමාජ සේවා අධ්‍යක්ෂ

## සමාජ සේවා දෙපාර්තමේන්තුව

### අපගේ දැක්ම

මානව සංවර්ධනයේ පෙරගමන්කරු වීම.

### අපගේ මෙහෙවර

සමාජයේ වෙසෙන අවාසි සහගත තත්ත්වයට පත්වූවන්ට අවැසි සේවා සැපයීම හා බල ගැන්වීම තුළින් ඔවුන් සමාජ සංවර්ධනයේ සක්‍රියකොටස්කරුවන් කිරීම.

### තේමාව

සතුට සපිරි අභිමානනීය සැබෑ මිනිසුන්ගෙන් පිරි පින්බර දේශයක් එක්ව ගොඩ නගමු.

### අපේ වටිනාකම්

1. සැමවිටම නොපැකිළව සේවය ලබා දෙමු.
2. ස්වයං විනය ආරක්ෂා කරමු.
3. අනෙකාට ගරු කරමු.
4. සේවාලාභියාගේ අවශ්‍යතා වෙනුවෙන් කොන්දේසි විරහිතව කැප වෙමු.
5. අද කළ යුතු දේ අදම කරමු.
6. සේවාලාභියාගේ සතුට අපේ සතුට කර ගනිමු.
7. ගවේෂණාත්මක විමර්ශනය තුළ සේවයට කැප වෙමු.
8. සැම ගැටළුවකටම විසඳුමක් ලබා දෙමු.
9. අවදානමට පෙර සූදානම් වෙමු.
10. සමාජ ගැටළුවල මූල හේතූන්ට නිර්මාණාත්මක ප්‍රවේශයක් ලබා දෙමු.
11. යහපාලනයෙන් කටයුතු කරමු.
12. සහකම්පනයෙන් යුතුව වැඩ කරමු.
13. අපි එක පවුලක් මෙන් වැඩ කරමු.
14. මානව දයාව පදනම් වූ සේවාවක් සපයමු.
15. සැමගේ හැකියාව අගයමු.
16. සැම නිමේශයක්ම සේවයට කැප කරමු.

# අරමුණු හා ක්‍රියාකාරකම්

## අරමුණු

- ආබාධ සහිත තැනැත්තන් සඳහා සමාන අවස්ථා සලසා දෙන බවට වග බලා ගැනීම.
- ආබාධ සහිත තැනැත්තන්ගේ වෘත්තීය නිපුණතා වැඩි දියුණු කිරීම සහ ඔවුන් ස්වාධීන පුරවැසියන් බවට පත් කිරීම.
- ආබාධ සහිත වූවන්ගේ ආර්ථික සුරක්ෂිතතාවය ඇති කිරීම හා යැපුම් මානසිකත්වය අවම කිරීම.
- විශේෂ අවශ්‍යතා ඇති ළමුන් සඳහා කල් තියා මැදිහත් වීම.
- සංඥා භාෂාව පිළිගැනීම හා ප්‍රවර්ධනය.
- ආබාධ සහිත පුද්ගලයන්ට නිදහස් සමාජයක ඵලදායීව සහභාගිවීමට හැකියාව ඇති කරවීම.
- ආබාධ සහිත පුද්ගලයින්ගේ පෞද්ගලිකත්වය, කුසලතා සහ නිර්මාණශීලීත්වය මෙන්ම මානසික හා කායික හැකියාවන් හැකි උපරිමය දක්වා සංවර්ධනය කිරීම.
- ආබාධ සහිත තැනැත්තන්ට සේවා සපයන නිලධාරීන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප උසස් තත්ත්වයට නංවාලීම.
- ආබාධ සහිත තැනැත්තන්ට සේවා සපයන ස්වේච්ඡා සංවිධාන බල ගැන්වීම.
- මතට ඇබ්බැහි වූවන් සමාජගත කිරීම.

## ක්‍රියාකාරකම්

- ආබාධ සහිත තරුණ තරුණියන් සඳහා වෘත්තීය පුහුණුව ලබාදීම, ස්වයං රැකියා සඳහා වෘත්තීය මෙවලම් ලබාදීම හා විවෘත රැකියා සඳහා යොමු කිරීම.
- ආබාධ සහිත වූවන් සඳහා රැකියා වෙළඳපොළ හඳුනා ගැනීම හා පුළුල් කිරීම.
- ආබාධ සහිත වූවන්ගේ කාලීන අවශ්‍යතා හා ප්‍රවණතා හඳුනා ගැනිමට පර්යේෂණ කිරීම.
- ආබාධ සහිත පුද්ගලයන් සඳහා ආධාරක උපකරණ සැපයීම.

- විශේෂ අවශ්‍යතා ඇති ළමුන් සඳහා කල්තියා මැදිහත්වීම තුළින් ඔවුන් අන්තර්කරණ අධ්‍යාපනය සඳහා යොමු කිරීම.
- සේවා සපයන නිලධාරීන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප ඉහළ නැංවීම සඳහා පුහුණු වැඩසටහන් මෙහෙයවීම.
- ශ්‍රවණාබාධිතවූවන් සඳහා හැඳුනුම්පත් ලබාදීම හා සංඥා භාෂා පරිවර්තන සේවා ලබාදීම තුළින් ශ්‍රවණාබාධිතවූවන්ගේ එදිනෙදා කටයුතු පහසු කරවීම.
- භාරකරුවන් අහිමි මන්ද මානසික පිරිමි ළමුන් සඳහා රැකවරණය සැපයීම.
- ආබාධ සහිත පුද්ගලයන්ගේ සුභ සාධනය සඳහා පවත්වාගෙන යනු ලබන ස්වේච්ඡා සංවිධාන සඳහා මූල්‍යාධාර සැපයීම.
- වයස අවු. 60ට අඩු දෘශ්‍යාබාධසහිත තැනැත්තන්ට පෙනීම ලබා දීම සඳහා අක්ෂි කාච ලබාදීම හා වෛද්‍යාධාර සැපයීම.
- දෘශ්‍යාබාධිත දරුවන්ට ක්‍රීඩා, අධ්‍යාපනික හා සංස්කෘතික ආධාර ලබාදීම.
- මතට ඇබ්බැහි වූවන් නේවාසිකව පුනරුත්ථාපනය කිරීම.
- පුණ්‍යායතන ලියාපදිංචි තත්ත්වය ලබා ගැනීම සඳහා නිර්දේශ ලබා දීම, ජල බිල්පත් හා විදුලි බිල්පත් සඳහා සහන ලබා ගැනීමට නිර්දේශ කිරීම.
- ප්‍රජා මූලික අන්තර්කරණ සංවර්ධන වැඩසටහන යටතේ ආබාධ සහිත වූවන් සඳහා අවැසි සේවා ලබාදීම
- ප්‍රාදේශීය මට්ටමින් ආබාධ සහිත පුද්ලයන්ගේ ස්වශක්ති සංවිධාන පිහිටුවීම හා බලගැන්වීම.
- ඒකාබද්ධ ප්‍රවේශය හරහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

# <u>සමාජ සේවා දෙපාර්තමේන්තුව</u>

## <u>කාර්යය මණ්ඩලය - 2014. 12. 31 දිනට</u>


| තනතුර | සේවය | ශ්‍රේණිය | වැටුප් තලය | අනුමත සංඛ්‍යාව | | | දැනට සිටින සංඛ්‍යාව | | | පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | ස්ථිර | අනියම | කොන්ත්‍රාත් | ස්ථිර | අනියම | කොන්ත්‍රාත් | |
| **ජ්‍යෙෂ්ඨ** | | | | | | | | | | |
| අධ්‍යක්ෂ | ශ්‍රී. ලං. ප.සේ. | I | SL 1-2006 | 1 | | | 1 | | | 0 |
| අතිරේක අධ්‍යක්ෂ | ශ්‍රී. ලං. ප.සේ. | I | SL 1-2006 | 1 | | | 1 | | | 0 |
| ප්‍රධාන ගණකාධිකාරි | ශ්‍රී. ලං. ග.සේ. | I | SL 1-2006 | 1 | | | 1 | | | 0 |
| ගණකාධිකාරි/අභ්‍යන්තර විගණක | ශ්‍රී. ලං. ග.සේ. | II/ III | SL 1-2006 | 2 | | | 0 | | | 2 |
| නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී. ලං. ප.සේ. | II/ III | SL 1-2006 | 3 | | | 3 | | | 0 |
| සමාජ සුබසාධන අධිකාරි | ස.සේ.දෙ. | III | SL 1-2006 | 3 | | | 3 | | | 0 |
| **තෘතියික** | | | | | | | | | | |
| පරිපාලන නිලධාරි | රා.ක.ස.සේ. සු.ප්‍රා. | | MN 7 - 2006 | 1 | | | 0 | | | 1 |
| ස්ථානභාර නිලධාරි | ස.සේ.දෙ. | | MN 7 - 2006 | 7 | | | 0 | | | 7 |
| සමාජ සේවා නිලධාරි | ස.සේ.දෙ. | I/ II/ III | MN 5 - 2006 | 156 | | | 128 | | | - |
| **ද්විතියික** | | | | | | | | | | |
| සමාජ සංවර්ධන සහකාර | ආශ්‍රිත සේවා | | MN 4 - 2006 | 196 | | | 196 | | | - |
| දෘශ්‍යාබාධිත සංවර්ධන නිලධාරි | ස.සේ.දෙ. | III | MN 4 - 2006 | 13 | | | 11 | | | 2 |
| සංවර්ධන නිලධාරි | ස.නි.සේ. | | MN 4 - 2006 | 160 | | | 145 | | | 15 |
| ආධුනික පරිවර්තක | ආශ්‍රිත සේවා | III | MN 4 - 2006 | 1 | | | 0 | | | 1 |
| වැඩසටහන් නිලධාරි | ස.සේ.දෙ. | | MN 4 - 2006 | 1 | | | 0 | | | *0 |
| වැඩ කළමනාකරු | ස.සේ.දෙ. | I/ II/ III | MT 3 - 2006 | 4 | | | 1 | | | 3 |
| වෘත්තීය උපදේශක | ස.සේ.දෙ. | III | MT 1 - 2006 | 51 | | 9 | 45 | | 5 | 6 (කොන්ත්‍රාත්4) |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| තොරතුරු, සන්නිවේදන හා තාක්ෂණ සහකාර | තො.ස.තා.ස. සේ. | I/ II/ III | MT 1 - 2006 | 1 | | | 1 | | | 0 |
| රාජ්‍ය කළමනාකාර සහකාර | රා.ක.ස.සේ. | III | MN 2 - 2006 | 44 | | | 31 | | | 13 |
| සංඥා භාෂා පරිවර්තක | ස.සේ.දෙ. | III | MN 1 - 2006 | 7 | | | 6 | | | 1 |
| පෙර පාසල් ගුරු | ස.සේ.දෙ. | I/ II/ III | MN 1 - 2006 | 3 | | | 3 | | | 0 |
| නිවාස පාලිකා | ස.සේ.දෙ. | I/ II/ III | MN 1 - 2006 | 12 | | | 4 | | | 8 |
| **ප්‍රාථමික** | | | | | | | | | | |
| රියදුරු | රියදුරු සේවය | I/ II/ III | PL 3 - 2006 | 13 | | | 12 | | | 1 |
| අරක්කැමි | ස.සේ.දෙ. | I/ II/ III | PL 2 - 2006 | 6 | | | 6 | | | 0 |
| ළමා සංවර්ධන සහකාර | ස.සේ.දෙ. | I/ II/ III | PL 1 - 2006 | 5 | | | 4 | | | 1 |
| අරක්කැමි ( සහයක) | ස.සේ.දෙ. | I/ II/ III | PL 1 - 2006 | 12 | | | 6 | | | 6 |
| උපස්ථායක | ස.සේ.දෙ. | I/ II/ III | PL 1 - 2006 | 21 | | | 22 | | | **0 |
| කාර්යාල කාර්යය සහයක | කා.කා.සේ. | I/ II/ III | PL 1 - 2006 | 40 | | | 36 | | | 4 |
| පුනරුත්ථාපන සහයක | කොන්ත්‍රාත් | | | 0 | | 9 | 0 | | 4 | 5 |
| එකතුව | | | | 765 | | 18 | 666 | | 9 | 81 |

*** බඳවා ගැනීම් නැත**

**** 25/2014 චක්‍රලේඛය යටතේ ස්ථිර තනතුරු**

# සංවිධාන ව්‍යුහය
# සමාජ සේවා දෙපාර්තමේන්තුව



## 1වන පරිච්ඡේදය

### මූල්‍ය ප්‍රගතිය

| | ප්‍රතිපාදන | වියදම<br>රු. | ප්‍රතිශතය |
|---|---|---|---|
| ප්‍රාග්ධන | **126,615,000.00** | **100,830,250.00** | **79.63** |
| පුනරාවර්තන | **328,232,500.00** | **326,358,100.00** | **99.42** |

### ප්‍රාග්ධන වියදම්වල ප්‍රගතිය

| | ප්‍රතිපාදන<br>රු. | වියදම<br>රු. | ප්‍රතිශතය |
|---|---|---|---|
| අනෙකුත් ප්‍රාග්ධන වැඩසටහන් | **26,615,000.00** | **24,276,316.00** | **91.21** |
| මිලියන 100 වැඩසටහන | **100,000,000.00** | **76,553,934.00** | **76.55** |

**වැඩසටහන 01 මෙහෙයුම් වැඩසටහන**

**ව්‍යාපෘතිය - 01 පරිපාලන හා ආයතන සේවා**

| කාණ්ඩය | 2014 වර්ෂයේ ඇස්තමේන්තුව<br>රු. | 2014 වර්ෂයේ මුළු වියදම<br>රු. |
|---|---|---|
| මුළු පුනරාවර්තන වියදම | **25,841,500.00** | **25,382,445.00** |
| පුද්ගල පඩි නඩි | **12,600,000.00** | **12,222,815.00** |
| වෙනත් පුනරාවර්තන වියදම් | **13,241,500.00** | **13,159,630.00** |

**වැඩසටහන 02 සංවර්ධන වැඩසටහන**

**ව්‍යාපෘතිය - 02 සමාජ සේවාවන් සඳහා මුදල්**

| කාණ්ඩය | 2014 වර්ෂයේ ඇස්තමේන්තුව<br>රු. | 2014 වර්ෂයේ මුළු වියදම<br>රු. |
|---|---|---|
| මුළු පුනරාවර්තන වියදම | **181,813,000.00** | **181,564,186.00** |
| පුද්ගල පඩි නඩි | **171,310,000.00** | **171,239,826.00** |
| වෙනත් පුනරාවර්තන වියදම් | **10,503,000.00** | **10,324,360.00** |

වැඩසටහන - 03පුනරුත්ථාපනය හා පුහුණු කිරීම් සේවා

| කාණ්ඩය | 2014 වර්ෂයේ ඇස්තමේන්තුව රු. | 2014 වර්ෂයේ මුළු වියදම රු. |
|---|---|---|
| මුළු පුනරාවර්තන වියදම | **120,578,000.00** | **119,411,469.00** |
| පුද්ගල පඩි නඩි | **57,345,000.00** | **56,823,873.00** |
| වෙනත් පුනරාවර්තන වියදම් | **63,233,000.00** | **62,587,596.00** |

## 2014 වර්ෂයේ අත්තිකාරම් ගිණුමේ සීමාවන්

| | සීමාව රු. | වියදම රු. |
|---|---|---|
| උපරිම වියදම් සීමාව | **15,000,000.00** | **12,109,412.38** |
| අවම ලැබීම් සීමාව | **11,200,000.00** | **13,375,397.67** |
| උපරිම හර ශේෂ සීමාව | **80,000,000.00** | **51,090,413.70** |

## 2014 වර්ෂයේ ආදායම් ඒකරාශී කිරීම

| ආදායම් සීමාව | 2014 ඇස්තමේන්තු ආදායම රු. | සත්‍ය ආදායම රු. |
|---|---|---|
| **2002-01-01** රජයේ ගොඩනැගිලි | | **96,430.60** |
| **2002-02-99** පොළිය වෙනත් (ර.නි.අ.පො.) | | **2,016,421.22** |
| **(2003- 99 -000)** අනෙකුත් ලැබීම් | | **2,032,286.29** |

## 2014 වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රතිපාදන හා වියදම්

| ව්‍යාපෘති අංකය | වැය ශීර්ෂය | ක්‍රියාකාරකම් | ප්‍රතිපාදන රු. | වියදම රු. |
|---|---|---|---|---|
| 1. | 2002 | යන්ත්‍ර සූත්‍ර හා උපකරණ අළුත්වැඩියාව | 110,000.00 | 73,298.00 |
| | 2003 | වාහන අළුත්වැඩියාව | 325,000.00 | 324,914.00 |
| | 2102 | කාර්යාලීය උපකරණ හා ගෘහ භාණ්ඩ මිලදී ගැනීම | 200,000.00 | 198,710.00 |
| | 2103 | යන්ත්‍ර සූත්‍ර හා උපකරණ මිලදී ගැනීම | 150,000.00 | 150,000.00 |
| | 2401 | පුහුණු කිරීමේ හා හැකියා වර්ධනය | 150,000.00 | 149,943.00 |
| | | එකතුව | 935,000.00 | 896,865.00 |
| 2. | 2401 | පුහුණු කිරීම් හා හැකියා වර්ධනය | 2,577,500.00 | 2,570,275.00 |
| | | එකතුව | 2,577,500.00 | 2,570,275.00 |
| 3. | 2001 | ගොඩනැගිලි අළුත්වැඩියාව හා නවීකරණය | 3,500,000.00 | 3,081,366.00 |
| | 2002 | යන්ත්‍රසූත්‍ර හා උපකරණ අළුත්වැඩියාව | 250,000.00 | 249,889.00 |
| | 2003 | වාහන අළුත්වැඩියාව | 250,000.00 | 249,290.00 |
| | 2102 | කාර්යාලීය උපකරණ හා ගෘහ භාණ්ඩ මිලදී ගැනීම | 500,000.00 | 499,563.00 |
| | 2103 | යන්ත්‍ර සූත්‍ර හා උපකරණ මිලදී ගැනීම | 400,000.00 | 398,006.00 |
| | 2104 | නව ඉදිකිරීම් | 2,500,000.00 | 2,120,312.00 |
| | 2502 - 4 | ජයවිරු සෙවන පුළුල් කිරීම | 7,000,000.00 | 5,381,069.00 |
| | 2502 - 5 | ප්‍රජා මූලික පුනරුත්ථාපන ව්‍යාපෘතිය | 9,000,000.00 | 8,829,681.00 |
| | 2502 - 6 | වෘත්තීය පුහුණු ආයතන නවීකරණය | 100,000,000.00 | 76,553,934.00 |
| | | එකතුව | 123,400,000.00 | 97,363,110.00 |
| | | මුළු එකතුව | 126,615,000.00 | 100,830,250.00 |

## මිලියන 100 ව්‍යාපෘතිය
## (ආබාධ සහිතවූවන් සඳහා වන වෘත්තීය පුහුණු ආයතන නවීකරණය)

මෙරට ආබාධ සහිත තරුණ තරුණියන් රටේ සංවර්ධනයට සක්‍රියව දායක කර ගැනීමේ ප්‍රබල අවශ්‍යතාවය දැඩි ලෙස මහා භාණ්ඩාගාරය වෙත අවධාරණය කරමින් සමාජ සේවා දෙපාර්තමේන්තුව විසින් කරන ලද විවිධ ඉල්ලීම්වල ප්‍රතිඵලයක් ලෙස 2014 වර්ෂයේ සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ආබාධ සහිත වූවන් සඳහා පවත්වාගෙන යනු ලබන වෘත්තීය පුහුණු ආයතන නවීකරණය සඳහා මිලියන 100 ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරයෙන් ලැබිණි.

මෙය විශේෂ ව්‍යාපෘතියක් ලෙස සලකා සමාජ සේවා දෙපාර්තමේන්තුවේ වෘත්තීය පුහුණුආයතනවල අවශ්‍යතා සැලකිල්ලට ගෙන ආබාධ සහිත වූවන්සඳහාවන වෘත්තීය පුහුණුව ඉහළ නැංවීමට අවශ්‍ය පාදක ව්‍යුහය පහසුකම් ඇතිකරලීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලදි. මේ සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නිරතුරුව එහි ප්‍රගතිය සමාලෝචනය කරමින්, වසරක් තුළ මෙම ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමට අවශ්‍ය කටයුතු කෙරුණි. තවද එම ව්‍යාපෘතිය යටතේ වත්තේගම වෘත්තීය පුහුණු ආයතනයේ ඉලෙක්ට්‍රොනික් හා ත්‍රීරෝද හා යතුරුපැදි අළුත් වැඩියා පුහුණු අංශ දෙකක් ආරම්භ කිරීමට මෙම වසරේ හැකි විය.ඒ අනුව පහත සඳහන් ක්‍රියාකාරකම් යටතේ එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලදි.

## <u>මිලියන 100 ව්‍යාපෘතියේ ප්‍රගතිය- ආබාධ සහිත වූවන් සඳහා වන වෘත්තීය පුහුණු ආයතන නවීකරණය කිරීම</u>

| අනු අංක | ක්‍රියාකාරකම් | ප්‍රතිපාදන (රු.) | මූල්‍ය ප්‍රගතිය (රු.) |
|---|---|---|---|
| 01. | නේවාසිකාගාර ඇතුළු ගොඩනැගිලි නවීකරණය | 47,242,900.00 | 36,439,627.43 |
| 02. | යන්ත්‍ර සූත්‍ර අළුත්වැඩියාව | 500,000.00 | 188,571.43 |
| 03. | පුස්තකාල පොත් | 475,000.00 | 464,505.50 |
| 04. | ක්‍රීඩා උපකරණ | 2,000,000.00 | 774,885.00 |
| 05. | ගෘහ භාණ්ඩ මිලදී ගැනීම | 20,382,237.00 | 19,000,652.85 |
| 06. | යන්ත්‍ර සූත්‍ර හා පුහුණු උපකරණ | 24,411,363.00 | 17,085,881.29 |
| 07. | චිකිත්සක ඒකකය සඳහා උපකරණ | 2,500,000.00 | 72,640.00 |
| 08. | ගෘහස්ථ ක්‍රීඩාගාර උපකරණ | 2,488,500.00 | 2,300,760.00 |
| 09. | පරිපාලන වියදම් | | 226,410.50 |
| එකතුව | | 100,000,000.00 | 76,553,934.00 |

## 2 වන පරිච්ඡේදය

## ආබාධ සහිතවූවන් සඳහා වන සුභසාධන වැඩසටහන

මානව ක්‍රියාකාරකම් හා විවිධ පාරිසරික හේතූන් මත ආබාධිත තත්ත්වයන්ට පත්වන පිරිස දිනෙන් දින ඉහළ අගයක් ගන්නා බව වාර්ෂික සංඛ්‍යා ලේඛන පරීක්ෂා කිරීමේදී පෙනීයයි. එහෙත්වර්තමානය දෙස බලන විට කුමන ආබාධයකින් පසුවන පුද්ගලයෙකු වුවද ඔහුට හෝ ඇයට සමාජය තුළ වටිනාකමක්, පිළිගැනීමක් හා අනන්‍යතාවයක් ඇත. එමෙන්ම ඔවුහු සමාජ සංවර්ධනයේ සැබෑ කොටස්කරුවෝය. එබැවින් ආබාධ සහිත පුද්ගලයින් සමාජයේ ගෞරවයට පාත්‍ර වූ අභිමානවත් පිරිසක් ලෙස ජීවත්වීමට අවශ්‍ය හිතකාමී පරිසරයක් නිර්මාණය කරදීම මෙම දෙපාර්තමේන්තුවේ වගකීමයි.

ඒ සඳහා ඔවුන්ගේ කුසලතාවයන් හොඳින් හඳුනාගෙන සමාජ ඇගයීමකට ලක්වන වටිනාකම් ඇති පිරිසක් ලෙස ක්‍රියා කිරීමට බල ගැන්විය යුතුය. ආබාධිත ප්‍රජාව සඳහා අවශ්‍ය රැකවරණය, ඔවුන්ගේ අයිතිවාසිකම් සුරැකීම හා ඔවුන්ගේ වෘත්තීමය හැකියාවන් බලගන්වමින් ජාතික සංවර්ධන ක්‍රියාවලියට යොමු කිරීමේ අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කොට ඇත. සෞඛ්‍ය අධ්‍යාපනය වැනි මූලික අවශ්‍යතා පමණක් නොව තාක්ෂණය හා සන්නිවේදනය, කලාව හා ක්‍රීඩාව පිළිබඳ ඔවුන්ට තිබෙන දැනුම කුසලතාවන් හා අත්දැකීම් සෙසු ලෝකයත් සමඟ බෙදා හදා ගැනීමට අවශ්‍ය සමාජ වටපිටාව සැකසී ඇත.

මෙම සුභසාධන වැඩසටහන යටතේ පහත සඳහන් ක්‍රියාකාරකම් සමාජ සේවා දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරනු ලබයි.

- **I.** ආබාධ සහිත තරුණ තරුණියන්ට වෘත්තීය පුහුණුව ලබාදීම.
- **II.** විශේෂ අවශ්‍යතා ඇති දරුවන් කල්තියා හඳුනා ගැනීම හා අවශ්‍ය මැදිහත්වීම හා ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථාන ව්‍යාප්ත කිරීම.
- **III.** ආබාධ සහිත තැනැත්තන් සඳහා කෘත්‍රිම අත් පා ලබාදීම.
- **IV.** ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන සඳහා මූල්‍ය ආධාර ලබාදීම.
- **V.** රාගම පුනරුත්ථාපන රෝහලේ සුෂුම්නා ආබාධ සහිත පුද්ගලයන් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් යොමු කරන එවැනි තත්ත්වයට පත් ආබාධ සහිත පුද්ගලයන් සඳහා වෘත්තීය පුහුණුව ලබා දීම.
- **VI.** භාරකරුවන් අහිමි මන්ද මානසික පිරිමි ළමුන් සඳහා රැකවරණය ලබාදීම.
- **VII.** දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල.
- **VIII.** සංඥා භාෂා සේවය ලබාදීම.

## ආබාධ සහිත තරුණ තරුණියන් පුනරුත්ථාපනය කිරීම හා වෘත්තීය පුහුණුව ලබාදීම

### සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ආයතන




ආබාධ සහිත තරුණ තරුණියන් සඳහා ඇතුළත්වීමට හැකිවන පරිදි ඉහත වෘත්තීය පුහුණු ආයතන ගම්පහ, හම්බන්තොට, මහනුවර, කොළඹ, පුත්තලම, රත්නපුර යන දිස්ත්‍රික්කවල ද ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය මහරගමද පිහිටුවා ඇත. වයස අවු. 16 – 35 ත් අතර තරුණ තරුණියන් බඳවා ගැනීමේ ක්‍රමවේදයන්ට අනුව, වෘත්තීය පුහුණුව සඳහා ඇතුළත් කර ගැනීම සිදු කෙරේ. වසරක කාලයක් නේවාසිකව පුහුණුව ලබා දෙනු ලැබේ. වායු සමීකරණ හා ශීතකරණ, මෝටර් කාර්මික, ආහාර තාක්ෂණය, රූපවාහිණී හා ගුවන්විදුලි අළුත්වැඩියා කිරීම, සම් කර්මාන්තය හා පාවහන් අළුත්වැඩියාව වැනි පිළිගත් ජාතික නිපුණතා පාඨමාලා ඇතුළු විවිධ පාඨමාලා හැදෑරීම සඳහා අභ්‍යාසලාභීන්ට අවස්ථාව ලැබේ. පුහුණු කාලය තුළ ආහාර පාන, වෛද්‍ය පහසුකම්, නේවාසික පහසුකම් හා දෛනික දීමනාද සපයනු ඇත.

මෙහිදී පාඨමාලාවන්ට පරිබාහිරව ක්‍රීඩා හා සෞන්දර්ය කුසලතා වැඩි දියුණු කර ගැනීම සඳහා අවස්ථාව සැලසේ. ජාතික මට්ටමින් හා ජාත්‍යන්තර මට්ටමින් තරඟ නියෝජනය සඳහාද අවස්ථාව

සැලසේ. සාර්ථකව පුහුණුව අවසන් කරනු ලබන අභ්‍යාසලාභීන් සඳහා සහතිකපත් හා ස්වයං රැකියා සඳහා මෙවලම් ලබා දීම, රැකියා අවස්ථා හඳුන්වාදීම හා පසුහාර කටයුතු සිදු කරනු ලබයි.

## 2014 වර්ෂයේ වෘත්තීය පුහුණු ආයතන වල අභ්‍යාසලාභීන්ගේ සෞන්දර්යාත්මක හා ක්‍රීඩා ජයග්‍රහණ

### අමුණුකුඹුර වෘත්තීය පුහුණු ආයතනය

- <u>නර්තන</u>

**2014**-ප්‍රථම ස්ථානය - බස්නාහිර පළාත් සාහිත්‍ය කලා තරඟාවලිය - දිස්ත්‍රික් මට්ටම - (කණ්ඩායම්)

**2014**-ප්‍රථම ස්ථානය - ආබාධ සහිත තැනැත්තන් සඳහා වන රාජ්‍ය කළා උළෙල - දිස්ත්‍රික් මට්ටම - (කණ්ඩායම් නව නිර්මාණ 18න් ඉහළ)

**2014**- ප්‍රථම ස්ථානය - ආබාධ සහිත තැනැත්තන් සඳහා වන රාජ්‍ය කළා උළෙල - දිස්ත්‍රික් මට්ටම - (කණ්ඩායම් නව නිර්මාණ 18න් පහළ)

**2014** - ප්‍රථම ස්ථානය - ආබාධ සහිත තැනැත්තන් සඳහා වන රාජ්‍ය කළා උළෙල - දිස්ත්‍රික්මට්ටම - (කණ්ඩායම් ශාස්ත්‍රීය 18න් පහළ)

- <u>ගද්‍ය රචනා</u>

**2014** බස්නාහිර පළාත් කළා උළෙල - (බුද්ධි ඌනතා අය සඳහා)
18න් පහළ - ප්‍රථම ස්ථානය - මධුෂාන් අසංක
18න් පහළ - ප්‍රථම ස්ථානය - උදාර ඉඳුනිල්

- <u>ක්‍රීඩා</u>


**2014** -දෙවන ස්ථානය - සන්ෂයින් ක්‍රීඩා උළෙල - උස පැනීම - කේ.පී.ඩී. මාලිංග
**2014** -දෙවන ස්ථානය - සන්ෂයින් ක්‍රීඩා උළෙල - දුර පැනීම - ආර්.එම්. තිළිණ මදුසංක
**2014** -දෙවන ස්ථානය - සන්ෂයින් ක්‍රීඩා උළෙල - යගුලිය විසිකිරීම - ආර්.එම්. තිළිණ මදුසංක
**2014**-ප්‍රථම ස්ථානය - සන්ෂයින් ක්‍රීඩා උළෙල - දුර පැනීම - ඒ.පී. ලහිරු සමීර
**2014**-ප්‍රථම ස්ථානය - සන්ෂයින් ක්‍රීඩා උළෙල - මීටර් 200 දිවීම - දිනේෂ් මදුසංක
**2014**-ප්‍රථම ස්ථානය - සන්ෂයින් ක්‍රීඩා උළෙල - යගුලිය විසිකිරීම - දිනේෂ් මදුසංක
**2014**-ප්‍රථම ස්ථානය - සන්ෂයින් ක්‍රීඩා උළෙල - දුර පැනීම - ඒ.පී. ලහිරු සමීර

**2014**-තෙවන ස්ථානය - සන්ෂයින් ක්‍රීඩා උළෙල - මීටර් 200 දිවීම - ඒ.පී. ලහිරු සමීර
**2014**-තෙවන ස්ථානය - සන්ෂයින් ක්‍රීඩා උළෙල - මීටර් 100 දිවීම - කේ.ඒ. ඉසුරු සඳරුවන්
**2014**-තෙවන ස්ථානය - සන්ෂයින් ක්‍රීඩා උළෙල - මීටර් 200 දිවීම - ඊ.ඒ. රුවන් සමීර
**2014**-තෙවන ස්ථානය - සන්ෂයින් ක්‍රීඩා උළෙල - යගුලිය විසි කිරීම - එස්.ඩී. චරිත් අජන්ත
**2014**-පථම ස්ථානය - ලංකා බද්ධි ඌනතා වවන්ගේ සංගමය - කිකට් - ජාතික මට්ටම -

### වත්තේගම වෘත්තීය පුහුණු ආයතනයේ ජයග්‍රහණ

- **2014** වර්ධයේ ආබාධ සහිත වූවන් සඳහා වන රාජ්‍ය කළා උළෙලේ ශාස්ත්‍රීය හා ගැමි නැටුම් (කණ්ඩායම්) මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රථම ස්ථානයද, චිත්‍ර තරඟ සඳහා සහභාගී වූ අභ්‍යාසලාභීන් 5 දෙනෙකු සඳහා ද ජයග්‍රහණහිමි විය.

## සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ආයතන



වෘත්තීය පුහුණුව ලබාදීමට අමතරව විශේෂ අවශ්‍යතා ඇති දරුවන් සඳහා සේවා සැපයීම, ශ්‍රවණාබාධිතවූවන් සඳහා විශේෂ හැඳුනුම්පත් ලබාදීම, ශ්‍රවණාබාධිතවූවන් හා සෙමෙන් මනස වැඩෙන ළමුන්හට අධ්‍යාපනය ලබා දෙන පෙර පාසල් ගුරුවරුන් සඳහා දීමනා ලබාදීම, සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ මූල්‍ය අනුග්‍රහය ලබන ස්වේච්ඡා සමාජ සේවා ආයතන සඳහා නඩත්තු ආධාර හා යථායෝග්‍යාධාර ලබා දීම හා ශ්‍රවණාබාධිතවූවන් සඳහා සංඥා භාෂා සේවා ලබා දීම ද සිදු කෙරේ. මෙම සුභසාධන වැඩසටහන යටතේ 2014 කරන ලද විවිධ කාර්යයන්වල සංක්ෂිප්ත වාර්තාව පහත සඳහන් වේ.

| අනු අංකය | ක්‍රියාකාරකම් | අරමුණ | ඉලක්ක | 2014 වෙන් කරන ලද ප්‍රතිපාදන රු. මිලියන | 2014 වැය වූ මුදල රු. මිලියන | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|
| 01. | ආබාධ සහිත තරුණ තරුණියන් සඳහා වෘත්තීය පුහුණුව ලබාදීම. | ආබාධ සහිත තරුණ තරුණියන්ගේ වෘත්තිමය හැකියාවන් වැඩි දියුණු කිරීම. | ආබාධ සහිත තරුණ තරුණියන් 700ක් සඳහා වෘත්තීය පුහුණුව ලබා දීම. | 18.000 | 17.24 3 | සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පවත්වාගෙන යනු ලබන වෘත්තීය පුහුණු ආයතන 08(*1)ක සහ ස්වේච්ඡා ආයතන 08(*2)ක සේවාලාභීන් 633ක් සඳහා පුහුණුව ලබාදීම. |
| 02. | විශේෂ අවශ්‍යතා ඇති ළමුන් සඳහා සේවා සැපයීම. | අන්තර්කරණ අධ්‍යාපනය හා විධිමත් අධ්‍යාපනයට විශේෂ අවශ්‍යතා ඇති ළමුන් යොමු කිරීම. | විශේෂ අවශ්‍යතා ඇති ළමුන් 100ට සේවා සැපයීම. | 0.400 | 0.416 | විශේෂ අවශ්‍යතා ඇති ළමුන් 104 දෙනෙකු සඳහා සේවා සැපයීම. |
| 03. | පුහුණුව නිම කළ අභ්‍යාසලාභීන්ට වෘත්තීය මෙවලම් කට්ටල ලබාදීම හා සහතිකපත් ලබාදීම | පුහුණුව නිම කළ සේවාලාභීන් ස්වයං රැකියාවලට යොමු කිරීම තුළින් ආර්ථිකය ශක්තිමත් කිරීම. | පුහුණුව නිම කළ අභ්‍යාසලාභීන් 145ට මෙවලම් කට්ටල ලබා දීම. | 2.000 | 1.228 | පුහුණුව නිම කළ අභ්‍යාසලාභීන් 103 ක් සඳහා මෙවලම් කට්ටල ලබාදීම. |
| 04. | ආබාධ සහිත තැනැත්තන් සඳහා ආධාරක උපකරණ ලබා දීම. | වඩාත් ක්‍රියාශීලිව හා සමාජානුයෝජනයෙන් යුක්තව කටයුතු කිරීමට සහාය වීම. | ආබාධ සහිත පුද්ගලයින් 75 දෙනෙකු සඳහා ආධාරක උපකරණ ලබා දීම. | 0.500 | 1.015 | කෘත්‍රිම අත් පා හා කැලිපර්ස් 93ක් ලබාදීම. |
| 05. | ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන සඳහා මූල්‍යාධාර සැපයීම. | සමාජ සේවා කටයුතුවල යෙදෙන ස්වේච්ඡා සංවිධාන වඩාත් ඵලදායි | සංවිධාන 09ක් සඳහා නඩත්තු ආධාර ලබාදීම. | 2.500 | 1.784 | සංවිධාන 06(*3) ක් සඳහානඩත්තු ආධාර සපයා ඇත. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | සේවාවක් ලබාදීම සඳහා දිරිමත් කිරීම. | | | | |
| 06. | ශ්‍රවණාබාධිත හා සෙමෙන් මනස වැඩෙන ළමුන්ගේ පෙර පාසල් ගුරුවරුන් සඳහා දීමනා ලබාදීම. | ආබාධ සහිත දරුවන් හට අධ්‍යාපනය ලබා දීම. | පෙර පාසල් ගුරුවරුන් 05 දෙනෙකු සඳහා ගෙවීම් කිරීම. | 0.400 | 0.292 | පෙර පාසල් ගුරුවරුන් 05* (4) දෙනෙකු සඳහා මූල්‍යාධාර ලබාදීම. |
| 07. | ආබාධ සහිතවූවන් විවෘත හා ස්වයං රැකියා සඳහා යොමු කිරීම. | යැපුම් මානසිකත්වය අවම කිරීම. | ආබාධ සහිතවූවන් 75 දෙනෙකු රැකියා සඳහා යොමු කිරීම. | | | ආබාධ සහිතවූවන් 82 දෙනෙකු විවෘත හා ස්වයං රැකියා සඳහා යොමු කිරීම. |
| 08. | ශ්‍රවණාබාධිතවූවන් සඳහා විශේෂ හැඳුනුම්පත් නිකුත් කිරීම. | ශ්‍රවණාබාධිතවූවන් හඳුනාගැනීම පහසු කිරීම. | 50 දෙනෙකු සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීම. | | | ශ්‍රවණාබාධිතවූවන් 464 දෙනෙකු සඳහා විශේෂ හැඳුනුම්පත් නිකුත් කිරීම. |
| 09 | විශේෂ අවශ්‍යතා ඇති ළමුන් සඳහා ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම. | විශේෂ අවශ්‍යතා ඇති ළමුන් සඳහා වේලාසන මැදිහත් වීම. | | 4.200 | 0.447 | රත්නපුර ළමාමාර්ගෝපදේශන මධ්‍යස්ථානය සඳහා මූල්‍යාධාර ලබා දීම. |
| 10. | ශ්‍රවණාබාධිතවූවන් සඳහා සංඥා භාෂා සේවා ලබාදීම. | සන්නිවේදනය පහසු කිරීම. | | | | ශ්‍රවණාබාධිත වූවන් සඳහා සේවා වාර 203ක් ලබාදීම. |

### (*1)සමාජ සේවා දෙපාර්තමේන්තුවේ වෘත්තීය පුහුණු ආයතනවල අභ්‍යාසලාභීන් සංඛ්‍යාව

| අනු අංකය | ආයතනය | 2014 අභ්‍යාසලාභීන් සංඛ්‍යාව |
|---|---|---|
| 01. | සීදූවවෘත්තීය පුහුණු ආයතනය | 127 |
| 02. | කැටවල වෘත්තීය පුහුණු ආයතනය | 51 |
| 03. | වත්තේගම වෘත්තීය පුහුණු ආයතනය | 117 |
| 04. | තෙළඹුයාය වෘත්තීය පුහුණු ආයතනය | 64 |
| 05. | අමුණුකුඹුර වෘත්තීය පුහුණු ආයතනය | 57 |
| 06. | රාගම වෘත්තීය පුහුණු ආයතනය | 21 |
| 07. | විහවි සංවර්ධන පදනම | 16 |
| 08. | මාදම්පේ වෘත්තීය පුහුණු ආයතනය | 21 |
| එකතුව | | 474 |

**(*2) සමාජසේවා දෙපාර්තමේන්තුවේ මූල්‍ය අනුග්‍රහය ලබා ස්වේච්ඡා වෘත්තීය පුහුණු ආයතනවල අභ්‍යාසලාභීන් සංඛ්‍යාව**

| අනු අංකය | ආයතනය | 2014 අභ්‍යාසලාභීන් සංඛ්‍යාව |
|---|---|---|
| 01. | ආබාධ සහිත කාන්තාවන්ගේ සංගමය-තලාව | 12 |
| 02. | සවිය සංවර්ධන පදනම | 15 |
| 03. | ආබාධිත පුද්ගල සංවර්ධන පදනම | 41 |
| 04. | ඉස්ලාමීය ආබාධිත ආයතනය - තිහාරිය | 35 |
| 05. | සර්වෝදය සුවසෙත ආයතනය | 09 |
| 06. | සහනය ආයතනය | 26 |
| 07. | බටුගම්මන වෘත්තීය පුහුණු ආයතනය | 16 |
| 08. | සුබිත වෘත්තීය පුහුණු ආයතනය | 05 |
| එකතුව | | 159 |

| අනු අංකය | (*3)මූල්‍යාධාර සැපයූ සමාජ සේවා සංවිධාන | වියදම (රු.) |
|---|---|---|
| 01. | බිහිරි සේවා මණ්ඩලය-රාජගිරිය | 40,000.00 |
| 02. | උදපාදී භාරය-රත්මලාන | 966,600.00 |
| 03. | ස්වර්ණදාම පදනම -දූන්කන්නාව | 30,000.00 |
| 04. | අසරණ සරණ සමිතිය -කොළඹ | 360,100.00 |
| 05. | Development and Disability -කැලණිය | 60,000.00 |
| 06. | විහඩි සංවර්ධන පදනම -කළවාන | 328,000.00 |
| එකතුව | | 1,784,700.00 |

| අනු අංකය | * (4)මූල්‍යාධාර සැපයූ පෙර පාසල් |
|---|---|
| 01. | වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - පෙර පාසල් 01 |
| 02. | කටුවන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - පෙර පාසල් 02 |
| 03. | මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - පෙර පාසල් 01 |
| 04. | මීරිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - පෙර පාසල් 01 |

## ජයවිරු සෙවන ආයතනය

දෙමාපියන් හා භාරකරුවන් අහිමි මන්ද මානසික පිරිමි ළමුන් සඳහා රැකවරණය හා නේවාසික පහසුකම් සැපයීමේ ආයතනයක් සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් පවත්වාගෙන යනු ලැබේ. එම ආයතනය පුවක්පිටියේ පිහිටා ඇති අතර 50 දෙනෙකු සඳහා සේවාවන් සැපයිය හැකිය. 2014 වර්ෂයේ 47 දෙනෙකු සඳහා සේවා සපයා ඇත. දිනෙන් දින මන්ද මානසික ළමුන් නේවාසික කිරීමේ ඉල්ලීම්වල සීඝ්‍ර වැඩි වීමේ ප්‍රවනතාවයක් හඳුනා ගැනීමට හැකිවූඅතර එහි ප්‍රතිඵලයක් වශයෙන් එම ආයතනය පුළුල්කළයුතු බව අවධාරණය විය.

ඒ අනුව මෙම දෙපාර්තමේන්තුව මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කළ ව්‍යාපෘති යෝජනාවකට අනුව 2014 වර්ෂයේ 100දෙනෙකු සඳහා නේවාසික පහසුකම් ලබාදීමට හැකිවන පරිදි පළමු අදියරේ නව ඉදිකිරීම් ආරම්භ කිරීමට රු. මිලියන 7ක් ලබා දුන් අතර දෙවන අදියර සඳහා 2015 වර්ෂයට මිලියන 6ක් දවෙන් විය. මුල් අදියරේනවඉදිකිරීම් කටයුතු 2014 වර්ෂයේ ආරම්භ කිරීමට හැකිවිය.

## ළමා මාර්ගෝපදේශන ව්‍යාපෘතිය

ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය - මහරගම

ළමයෙකුගේ වර්ධනයේ කිසියම් ගැටළුවක් හෝ ප්‍රමාදයක් ඇති බවට සැක සහිත අවස්ථාවකදී හෝ ආබාධයක් ඇති බවට හඳුනාගත් පසුව යොමු විය යුත්තේ ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථාන වෙතයි. දෙමාපියන්ගේ මානසික තත්ත්වය ඉහළ නැංවීම, දරුවා සංවර්ධනය කිරීම සඳහා කල් ඇතිව මැදිහත් වීම, මූලික සේවා සැපයීම හා අවශ්‍ය සෞඛ්‍ය, මුල් ළමාවිය, අධ්‍යාපන හා සුභසාධන සේවා සම්බන්ධීකරණය කිරීමේ වගකීම දරණ රාජ්‍ය අංශයේ ආයතනය නාවින්නේ ඇති ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානයයි.


මෙම ව්‍යාපෘතිය යටතේ සේවා සපයන ළමුන් මැනවින් සංවර්ධනය වූ පසු විශේෂ පාසල්වලට, විශේෂ අධ්‍යාපන ඒකකවලට හා සාමාන්‍ය පාසල්වලට අන්තර්කරණය කරනු ලබයි.

ව්‍යෘපෘතියේ අරමුණු

- ළමා ආබාධ හඳුනා ගෙන කල් ඇතිව මැදිහත්වීමේ වඩාත් ඵලදායි ක්‍රමවේදයක් හඳුන්වා දීම.
- ආබාධ සහිත දරුවන්ට සේවා සැපයීම සම්බන්ධ විවිධ ක්ෂේත්‍රවලට අදාළ ආයතන ඇතුළත් සේවා ජාලය ශක්තිමත් කිරීම.
- විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ මුල් ළමාවිය අධ්‍යාපනය හා අන්තර්කරණ අධ්‍යාපනය ශක්තිමත් කිරීම.
- දෙමාපියන්ගේ හා පවුලේ සාමාජිකයන්ගේ මානසික තත්ත්වය වඩාත් යහපත් තත්ත්වයට ගෙන ඒම සඳහා උපදේශන සේවා ලබාදීම.
- ව්‍යාපෘතිය වෙනත් දිස්ත්‍රික්කවලට ව්‍යාප්ත කිරීම.

ඉලක්ක කණ්ඩායම

- වයස අවුරුදු 0 සිට 05 දක්වා විශේෂ අවශ්‍යතා සහිත දරුවන්



1. ළමුන් සංවර්ධනය කිරීම සඳහා කුඩා දරුවන් සිටින දෙමාපියන්ට පන්ති/ තනි පන්ති/ කණ්ඩායම් පන්ති පැවැත්වීම.
2. භෞත චිකිත්සක/ වෘත්තීය චිකිත්සක/ කථන චිකිත්සක සේවා ලබා දීම.
3. පෙර පාසල් ගුරු පුහුණු පාඨමාලා
4. දෙමාපියන්ගේ මානසික තත්ත්වය ඉහළ නැංවීම සඳහා මනෝ උපදේශන වැඩසටහන්
5. සෞඛ්‍ය සායන

මෙම වසරේ ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය විශේෂ අවශ්‍යතා ඇති ළමුන් 104 දෙනෙකු සඳහා චිකිත්සක, අධ්‍යාපන හා වෙනත් සේවා ලබා දීමට හැකි වූ අතර ඔවුන්ගේ දෙමාපියන් 252 දෙනෙකුට උපදේශන සේවා ලබා දී ඇත.සංවර්ධනය කරන ලද ළමුන් 22 දෙනෙකු සාමාන්‍ය පෙර පාසල්වලටද, 37 දෙනෙකු සාමාන්‍ය පාසල් හා විශේෂ ඒකකවලටද, එක් අයෙකු විශේෂ පාසලකටද අන්තර්කරණය කිරීමට හැකිවිය.

2015 වසරේ සිට දිවයිනේ සෙසු ප්‍රදේශවලට මෙම ව්‍යාපෘතිය ව්‍යාප්ත කිරීම සඳහා මූලික කටයුතු දැනටමත් සැලසුම් කර ඇත.

එක් එක් අංශයේ ලබාදුන් මුළු සේවාවන් විස්තර

| අනු අංකය | ලබාදුන් සේවය | සේවා ළමුන් සංඛ්‍යාව | සේවා වාර ගණන |
|---|---|---|---|
| 01. | භෞත චිකිත්සක ප්‍රතිකාර | 107 | 471 |
| 02. | කථන චිකිත්සක ප්‍රතිකාර | 128 | 324 |
| 03. | වෘත්තීය චිකිත්සක ප්‍රතිකාර | 84 | 261 |
| 04. | අධ්‍යාපන අංශයේ පන්ති හා ළමා නිරීක්ෂණ | 170 | 4397 |
| 05. | උපදේශන සේවා | 252 | 295 |

2014 වර්ෂයේ ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානයේ සේවාලාභී ළමුන් පිළිබඳ තොරතුරු

01. ආයතනයට යොමු කිරීම

| අනු අංකය | යොමුවූ ආකාරය | ළමුන් ගණන |
|---|---|---|
| 01. | සේවාලාභී දෙමාපියන් | 40 |
| 02. | රජයේ රෝහල්<br>(රිජ්වේ ආර්යා ළමා රෝහල, කළුබෝවිල රෝහල) | 26 |
| 03. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල<br>(පාදුක්ක ස.සේ.නි 04, මොරටුව ස.සේ.නි. 01) | 05 |
| 04. | ආයතනයේ කාර්යය මණ්ඩලය | 07 |
| 05. | පෙර පාසල් ගුරුවරුන් | 16 |
| 06. | වෙනත් (විවිධ ආයතන, රූපවාහිණිය) | 11 |
| එකතුව | | 105 |

## 01. වයස් මට්ටම් අනුව

| අනු අංකය | වයස් මට්ටම | ළමුන් ගණන |
|---|---|---|
| 01. | 0 - 3 | 38 |
| 02. | 4 - 5 | 43 |
| 03. | 6 - 15 | 23 |
| 04. | 16ට වැඩි | 01 |
| එකතුව | | 105 |

## 03. ආබාධය අනුව

| අනු අංකය | ආබාධය | ළමුන් ගණන |
|---|---|---|
| 01. | Autism | 24 |
| 02. | Cerebral Palsy | 08 |
| 03. | Down Syndrome | 19 |
| 04. | Global Development Delay | 04 |
| 05. | Mentally Retardation | 01 |
| 06. | Speech difficulties | 19 |
| 07. | Development Delay | 20 |
| 08. | Hearing impairment | 02 |
| 09. | Other | 08 |
| එකතුව | | 105 |

## 2014 වර්ෂය තුළ කළ වැඩසටහන්

| අනු අංකය | මාසය | ස්ථානය | ස්ථානය | සහභාගී වූ සංඛ්‍යාව | වියදම රු. |
|---|---|---|---|---|---|
| 01. | ජනවාරි 03 | 2014 වසර ආරම්භයේ සේවාවන් ආරම්භ කිරීම හා දෙමාපිය සාකච්ඡා | ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය | 26 | |
| 02. | ජනවාරි 08 | පස්සර පැවැත්වූ වැඩමුළුව පිළිබඳ කාර්යය මණ්ඩලය දැනුවත් කිරීම හා 2014- ක්‍රියාකාරී සැලැස්ම සාකච්ඡා කිරීම | ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය | 13 | |
| 03. | ජනවාරි 20 | රාජකාරී විස්තරපිළිබඳ දැනුවත්කිරීම්හාළමුන්සඳහාක්‍රියාකාරකම් | ළමාමාර්ගෝපදේශන මධ්‍යස්ථානය | 13 | |
| 04. | ජනවාරි 22 | සොබාදහම් චිකිත්සක ඇකඩමිය යටතේ දෙමාපියන් දැනුවත් කිරීම හා ළමයින් සඳහා ක්‍රියාකාරකම් | ළමාමාර්ගෝපදේශන මධ්‍යස්ථානය | 108 | 6,110.00 |
| 05. | ජනවාරි 29 | සමාජ සේවා අතිරේක අධ්‍යක්ෂ විසින් ආයතනය නිරීක්ෂණය කිරීම හා වැඩසටහන් සාකච්ඡා කිරීම. | ළමාමාර්ගෝපදේශන මධ්‍යස්ථානය | 13 | |
| 06. | පෙබරවාරි 10 | ළමයින්ගේ ප්‍රගතිය පිළිබඳ දෙමාපියන්, කාර්ය මණ්ඩල, චිකිත්සකවරුන් එක්ව සාකච්ඡා කිරීම හා ඉදිරි ක්‍රියාකාරකම් තීරණය කිරීම | ළමාමාර්ගෝපදේශන මධ්‍යස්ථානය | 17 | |
| 07. | පෙබරවාරි 11 | කාර්යාල ක්‍රම පිළිබඳ කාර්ය මණ්ඩල දැනුවත් කිරීම | ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය | 13 | |
| 08. | පෙබරවාරි | සොබාදහම් චිකිත්සක ඇකඩමිය යටතේ | මාදිවෙල සංස්කෘතික | 108 | 8,110.00 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 12 | දෙමාපියන් හා දරුවන් වෙනුවෙන් ප්‍රායෝගික වැඩසටහන | මධ්‍යස්ථානය | | |
| 09. | පෙබරවාරි 17 | ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය ආරම්භ කොට එකොළොස් වසරක් පිරීම නිමිත්තෙන් ආගමික වැඩසටහන යටතේ ධර්ම දේශනය | ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය | 169 | 3,920.00 |
| 10. | මාර්තු 3,4,6,7, 11,17,18, 27,31 | සේවය ලබාදුන් ළමුන්ගේ ප්‍රගතිය සාකච්ඡා කිරීම | ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය | 17 | |
| 11. | මාර්තු 13 | පෙර පාසල්වලට යොමු කළ ළමුන් වෙනුවෙන් වැඩිදුර සේවය ලබාදීම පිළිබඳව දෙමාපියන් සමඟ සාකච්ඡා කිරීම | ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය | 108 | 3,720.00 |
| 12. | මාර්තු 24 | ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථාන ව්‍යාප්ත කිරීම හා ප්‍රාදේශීය මධ්‍යස්ථාන ඇරඹීම පිළිබඳ දිස්ත්‍රික් සමාජ සේවා නිලධාරීන්ගේ වැඩමුළුව | ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය | 22 | 8,697.00 |
| 13. | මාර්තු 22,23,24 | පෙර පාසල් ගුරු පුහුණු සහතිකපත්‍ර පාඨමාලාව | කුලියාපිටිය | 33 | 55,180.00 |
| 14. | මාර්තු 13,26 | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල දැනුවත් කිරීම | (මහරගම, බොරලැස්ගමුව, දෙහිවල, කොලොන්නාව) | 02 | |
| 15. | අප්‍රේල් 1,3 | සේවය ලබාදුන් ළමුන්ගේ ප්‍රගතිය සාකච්ඡා කිරීම | ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය | 06 | |
| 16. | අප්‍රේල් 4,5 | විශේෂ අවශ්‍යතා සහිත ළමුන් සඳහා අන්තර්කරණ පිළිබඳ පෙර පාසල් ගුරු පුහුණු දෙදින වැඩසටහන | කොළොන්නාවප්‍රා.ලේ. කා. | 120 | 66,890.00 |
| 17. | අප්‍රේල් 24 | අවුරුදු උත්සවය | බුද්ධදාස ක්‍රීඩාංගනය | 85 | |
| 18. | මැයි 5,6,8 | සේවය ලබාදුන් ළමුන්ගේ ප්‍රගතිය සාකච්ඡා කිරීම | ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය | 11 | |
| 19. | මැයි 12,13 | විශේෂ අවශ්‍යතා සහිත ළමුන් සඳහා අන්තර්කරණ පිළිබඳ පෙර පාසල් ගුරු පුහුණු දෙදින වැඩසටහන | හොරණ ප්‍රා.ලේ.කා. | 120 | 7,600.00 |
| 20. | මැයි 24 | සිල් සමාදන් වීමේ වැඩසටහන | ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය | 80 | 8,822.00 |
| 21. | ජුනි 16 | පොසොන් පෙරහැර | ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය | 35 | |
| 22. | ජුලි 01 | ඩෙංගු මර්දන වැඩසටහන ක්‍රියාත්මක කිරීම(කාර්ය මණ්ඩලය හා දෙමාපියන්) | ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය | 23 | |
| 23. | ජුලි 02 | සේවාලාභී ළමුන්ගේ පසුවිපරම් කටයුතු-විශේෂ අධ්‍යාපන පාසල් නිරීක්ෂණය කිරීම | පනාගොඩ යුධහමුදා පාසලේ විශේෂ ඒකකය | 03 | |
| 24. | ජුලි 10 | සොබාදහම් චිකිත්සක ඇකඩමිය යටතේ දෙමාපියන් දැනුවත් කිරීම හා ළමයින් සඳහා ක්‍රියාකාරකම් | ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය | 42 | 5,000.00 |
| 25. | ජුලි 17 | 2015 වර්ෂයේ විධිමත් අධ්‍යාපනය සඳහා ළමුන් ඇතුළත් කිරීම පිළිබඳ විශේෂ වැඩමුළුව | ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය | 154 | 13,943.00 |
| 26. | අගෝස්තු 06 | ළමයින්ගේ කථන හා භාෂා සංවර්ධනය පිළිබඳ කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ සැලසුමේ සාකච්ඡා | ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය | 15 | |
| 27. | අගෝස්තු 06, 18 | විශේෂ අවශ්‍යතා සහිත ළමුන් සඳහා අන්තර්කරණ පිළිබඳ පෙර පාසල් ගුරු පුහුණු වැඩසටහනේ පෙර පාසල් තෝරා ගැනීමේ දෙවන පියවර | කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 15 | |
| | | | කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 50 | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 28 | අගෝස්තු 14,15 | වාර්ෂික චාරිකාව | අනුරාධපුරය | 125 | 80,128.00 |
| 29 | සැප්තැම්බර් 06 | රැකියාවල නියුතු දෙමාපියන්ගේ දරුවන්ට සේවය ලබාදීමේ අරමුණින් සෙනසුරාදා දිනයන්හි පන්ති පැවැත්වීම ආරම්භ කිරීම. | ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය | 17 | |
| 30 | සැප්තැම්බර් 09 | කථන හා භාෂා සංවර්ධනය පිළිබඳ වැඩසටහන | ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය | 13 | |
| 31 | සැප්තැම්බර් 19 | සොබාදහම් චිකිත්සක ඇකඩමිය යටතේ දෙමාපියන් දැනුවත් කිරීම හා ළමයින් සඳහා ප්‍රායෝගික ක්‍රියාකාරකම් වැඩසටහන ( සෞන්දර්ය විශේෂ ගුරු උපදේශක විමල් උඩුපිල මහතා සහභාගීත්වයෙන්) | ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය | 126 | 6,800.00 |
| 32 | සැප්තැම්බර් 29 | පල්ලෙපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැවැත්වූ මුල් ළමාවිය විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සංවර්ධනය කිරීමේ වැඩසටහන සඳහා සම්පත් පුද්ගල දායකත්වය සැපයීම. | පල්ලෙපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 02 | |
| 33 | සැප්තැම්බර් 30 | සෞඛ්‍ය හා පෝෂණය පිළිබඳ දෙමාපියන් දැනුවත් කිරීමේ ප්‍රායෝගික වැඩමුළුව (මහරගම සෞඛ්‍ය නිලධාරි කාර්යාලයේ මහජන සෞඛ්‍ය හෙද නිලධාරිනි යමුනා අමරසේන මහත්මිය විසින් වැඩසටහන මෙහෙයවන ලදි) | ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය | 69 | |
| 34 | ඔක්තෝම්බර් 01 | විශ්ව ළමා දිනය සැමරීමේ වැඩසටහන | ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය | 35 | |
| 35 | ඔක්තෝම්බර් 13 | විශේෂ අවශ්‍යතා සහිත ළමුන් සඳහා අන්තර්කරණ පිළිබඳ පාඨමාලාව | කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 25 | |
| 36 | ඔක්තෝම්බර් 18 | විශ්ව ළමා දිනය වෙනුවෙන් සේවාලාභී දරුවන්ගේ චාරිකාව( Water World හා කැලණිය) | ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය | 69 | 10,330.00 |
| 37 | ඔක්තෝම්බර් 17,21,23 | සේවාලාභී ළමුන්ගේ පසු විපරම් කටයුතු - පාසල් නිරීක්ෂණය කිරීම | කොට්ටාව ධර්මපාල විද්‍යාලය හෝමාගම මහා විද්‍යාලය | 09 | |
| 38 | නොවැම්බර් 11 | අන්තර්කරණය සඳහා තෝරාගත් පෙර පාසල් ගුරුවරුන්ට ප්‍රායෝගික පුහුණුව ලබාදීමේ වැඩමුළුව | ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය | 16 | 4,000.00 |
| 39 | නොවැම්බර් 29 | සෙනසුරාදා දින සේවයට පැමිණි දරුවන්ගේ ප්‍රගතිය සාකච්ඡා කිරීම | ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය | 17 | 465.00 |
| 40 | දෙසැම්බර් 05,09,10, 11,12,16, 17 | සේවාලාභී දරුවන්ගේ ප්‍රගතිය සාකච්ඡා කිරීම | ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය | 75 | |
| 41 | දෙසැම්බර් 17,18,19 | 2015 වසරේ දරුවන්ගේ වාර්ෂික සැලැස්ම සකස් කිරීම | ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය | 08 | |

## දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල

ශ්‍රී ලංකාව තුළ ආබාධ සහිත පුද්ගලයන් පිළිබඳ නව ආකල්ප වර්ධනය ක්‍රමයෙන් ආරම්භ වූයේ 1981 වර්ෂය ජාත්‍යන්තර ආබාධිත වර්ෂය ලෙස ප්‍රකාශයට පත්කිරීමත් සමඟය. ඒ අනුව යමින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ පාර්ලිමේන්තුව මගින් 1992 අංක 9 දරණ දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල නමින් පනතක් සම්මත කර රජයේ ගැසට් නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කොට ඇත. මෙම පනතට සමගාමීව ශ්‍රී ලංකාවේ වෙසෙන දෘශ්‍යාබාධිත පුද්ගලයන් වෙනුවෙන් ශ්‍රී ලංකා රජයේ විවිධ සේවාවන් ආරම්භ කරන ලදී.

දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල ක්‍රියාත්මක කරනුයේ කළමනාකරණ කමිටුවක් මඟිනි. මෙහි සභාපතිත්වය දරන්නේ එම අවස්ථාවේ සමාජ සේවා අමාත්‍යාංශ ලේකම් ධූරය දරන පුද්ගලයාය. කළමනාකරණ මණ්ඩලය මසකට වරක් රැස්වේ. අරමුදල පිළිබඳව විගණන කටයුතු රජයේ විගණන දෙපාර්තමේන්තුව හා අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මඟින් සිදු කෙරේ.

දෘශ්‍යාබාධිත තත්ත්වයට පත්වන පුද්ගලයන්ට අවශ්‍ය සේවා සැපයීම, පුනරුත්ථාපනය කිරීම හා සහන ලබාදීම මෙම අරමුදලේ මෙහෙවර වේ. ආබාධ සහිත පුද්ගලයන් සඳහා සමාන අවස්ථා ලබාදීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය මඟින් සම්මත කරගත් නීති රීතිවලට අදාළව කටයුතු කිරීම විශේෂත්වයයි.

අරමුණු

- දෘශ්‍යාබාධිත පුද්ගලයින් සඳහා අධ්‍යාපනික හා වෘත්තීය පුහුණු පහසුකම් සැලසීම.
- දෘශ්‍යාබාධිත පුද්ගලයින් සඳහා සේවා නියුක්ති අවස්ථා ඇති කිරීම හා අවශ්‍ය අවස්ථාවන්හිදී ඔවුන්ට ස්වයං රැකියා සඳහා මූල්‍යාධාර සහ මාර්ගෝපදේශන සැපයීම.
- දෘශ්‍යාබාධිත පුද්ගලයින් සඳහා ශාස්ත්‍රීය පාඨමාලා හැදෑරීමට හෝ වෘත්තීය පුහුණුව ලබා ගැනීමට අවස්ථාව සැලසීම, ස්වයං රැකියා පහසුකම් සැපයීම.
- දෘශ්‍යාබාධිත පුද්ගලයින්ගේ සුභසාධනය පිණිස යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම.
- දෘශ්‍යාබාධිත පුද්ගලයින් විසින් නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ සඳහා අලෙවි පහසුකම් සැපයීම.
- සමාන අයිතිවාසිකම් හා සමාන අවස්ථා ලබා ගැනීමට දෘශ්‍යාබාධිත තැනැත්තන් වළක්වාලන තත්ත්වයන් ඉවත් කිරීමට ක්‍රියා කිරීම.

දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදලේ ප්‍රධාන කාර්යයන්

1. ක්‍රීඩා දක්ෂතා වර්ධනය කර ගැනීම සඳහා අවශ්‍ය ආධාර ලබාදීම.
2. අධ්‍යාපනය හා සංස්කෘතික කටයුතු සඳහා ආධාර සැපයීම.
3. දෘශ්‍යාබාධිත විශ්ව විද්‍යාල සිසුන්ට ශිෂ්‍යාධාර ලබා දීම.
4. උසස් පෙළ හදාරන දෘශ්‍යාබාධිත සිසුන් සඳහා මුදල් ආධාර ලබා දීම.
5. අඩු ආදායම්ලාභීන්ට නොමිලේ අක්ෂි කාච ලබාදීම.
6. අන්ධභාවය වැළැක්වීම සඳහා වෛද්‍ය ආධාර සැපයීම.
7. දෘශ්‍යාබාධිත පුද්ගලයින් වෙනුවෙන් පුනරුත්ථාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
8. චලතාවය හා දිශානතිය පුහුණුව ලබාදීම සඳහා උපදේශන දීමනා ලබාදීම.
9. දෘශ්‍යාබාධිත කාන්තා මධ්‍යස්ථාන පවත්වාගෙන යාම.

## දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල

| ක්‍රියාකාරකම් | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | ප්‍රතිලාභීන් |
|---|---|---|---|
| 01. ක්‍රීඩා ආධාර | 100,000.00 | 100,000.00 | දෘශ්‍යාබාධිත ක්‍රිකට් කණ්ඩායම |
| 02. පුනරුත්ථාපන ආධාර | 1,050,000.00 | 1,044,127.00 | උපදේශකවරුන් 39 |
| 03. අධ්‍යාපන ආධාර | 1,350,000.00 | 1,380,324.00 | විශ්වවිද්‍යාල - 53<br>උසස් පෙළ - 10<br>දැස නොපෙනෙන දෙමාපියන්ගේ දැස පෙනෙන දරුවන් - 135 |
| 04. පරිපාලන වියදම් | 900,000.00 | 857,502.00 | |
| 05. අක්ෂි කාච හා අක්ෂි ප්‍රතිකාර | 1,290,000.00 | 1,272,972.61 | කාච - 123 |
| 06. දෘශ්‍යාබාධිත කාන්තා සුභසාධන මධ්‍යස්ථානය | 239,500.00 | 233,929.30 | 6 දෙනෙකු |
| 07. වෘත්තීය පුහුණුව | 160,500.00 | 160,500.00 | උපදේශකවරුන් - 3 |
| 08. විගණන ගාස්තු | 25,500.00 | 22,176.60 | |
| 09. මූල්‍ය වියදම් | 7,000.00 | 3,397.80 | |
| 10. විවිධ වියදම් | 520,000.00 | 518,192.00 | නයනාලෝකගම නිවාස 18ක වහල අළුත්වැඩියාව හා පානීය ජලනල පද්ධතිය වැඩි දියුණු කිරීම. |
| එකතුව | 5,642,500.00 | 5,593,121.31 | |

# 3 වන පරිච්ඡේදය

## මතට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය හා සමාජ ගත කිරීමේ ව්‍යාපෘතිය

ශ්‍රී ලංකාවේ වර්තමාන ගැටළු අතර විෂ මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූවන්ගේ ප්‍රමාණාත්මක වර්ධනයක් දක්නට ලැබේ. මෙම කණ්ඩායම ඵලදායී පිරිසක් ලෙස සමාජයට හා රටේ සංවර්ධනයට දායක කිරීම සමාජ සේවා දෙපාර්තමේන්තුවේ තවත් එක් කාර්යය භාරයකි.

### ජයවිරු සමාධි නිවහන

මෙරට මත්ලෝලීත්වයට ගොදුරු වන පිරිස් හා ගොදුරු වූවන් සඳහා නිවාරණ වැඩසටහන් හා පුනරුත්ථාපන වැඩසටහන් රැසක් මෙම ආයතනය මගින් ක්‍රියාත්මක කෙරේ. මත්ලෝලීත්වයට ගොදුරු වූවන් ඉන් මුදවා ගැනීම සඳහා නේවාසික පුනරුත්ථාපනයද, විෂහරනයද, හැකියා ප්‍රවර්ධන වැඩසටහන් ද නව ක්‍රමවේද ඔස්සේ ක්‍රියාත්මක වීම අද වනවිට සමාධි නිවහන තුළින් සිදුවේ.

මනෝ චිකිත්සක හා මනෝ විද්‍යාත්මක උපදේශන ක්‍රමයන් හා වෛද්‍ය විද්‍යාත්මකප්‍රවේශයන් ඔස්සේ මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූවන් ඉන් මුදවා ගැනීම සඳහා ප්‍රතිකාර මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කොට ඇත.

2014 වර්ෂය තුළ සේවාලාභීන්106 දෙනෙකු සඳහා සේවා අවස්ථා ලබා දී ඇත.මෙම සේවාලාභීන්ගෙන් 80% පමණ පිරිස බස්නාහිර පළාත නියෝජනය කරන අතර ඉන් බහුතරය හෙරොයින් මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූවන් වේ. ඉතිරි පිරිස ගංජා, ඇල්කොහොල්, මත්පෙති හා දුම්කොළ සඳහා ඇබ්බැහි වූවන් වේ. සේවාලාභීන්ගේ වයස් මට්ටම් සැලකූ කළඅවුරුදු 15 සිට 55 දක්වාවූ වයස් මට්ටම්වලට අයත් වේ. ඉන් 80% පමණ පිරිස අවුරුදු 15 සිට අවුරුදු 35 දක්වාවූ අය වේ. අධ්‍යාපන තත්ත්වය සැලකීමේදී 8 ශ්‍රේණියේ සිට සා/පෙළ දක්වා බහුතරයක් අධ්‍යාපන හදාරා ඇත. එක් අයකු පාසල් අධ්‍යාපනය හදාරා නොමැති අතර එක් උපාධිධාරයකු ද මෙම වර්ෂයේ සේවාලාභීන් අතර සිටියහ. ඔහු රජයේ නිලධාරියකු වීමද විශේෂ කාරණයක් ලෙස සැලකිය හැක. 2014 වර්ෂයතුළ සිදුවූ විශේෂතම කරුණ වන්නේ එක් සේවාලාභියෙකු ආයතනය තුළ සිටම අ.පො.ස (සා/පෙළ) විභාගයට පෙනී සිටිමයි.

මෙම සේවාලාභීන් ආයතනය වෙතයොමුවන්නේඅධිකරණයමඟින් හා ස්වෙච්ඡා පදනම මතය.ඉන් බහුතර පිරිස යොමුව ඇත්තේ ස්වෙච්ඡා පදනම මතය.2014 වර්ෂයේ ආයතනය තුළ කරනලද වැඩසටහන් පහත සඳහන් පරිදිවේ.

| අනු අංකය | පවත්වන ලද වැඩසටහන් | වාර සංඛ්‍යාව |
|---|---|---|
| **01.** | දෙමාපිය හමු | **03** |
| **02.** | වෛද්‍ය සායන | **03** |
| **03.** | ධර්ම දේශනා | **03** |
| **04.** | සංස්කෘතික වැඩසටහන් | **05** |
| **05.** | උපදේශන හා ධාරිතා සංවර්ධන වැඩසටන් | **12** |
| **06.** | බාහිර පරිසරයක දිය නෑමට යාම | **03** |
| **07.** | ශීල ව්‍යාපාර | **01** |

මෙම වැඩසටහන් සේවාලාභීන්ගේ කායික, මානසික මෙන්ම ආධ්‍යාත්මික සංවර්ධනය සඳහා උපකාරී වේ. සමාධි නිවහන පිහිටි භූමිය හා පරිසරය ගත් කළ සේවාලාභීන්ගේ කායික හා මානසික වර්ධනයට බෙහෙවින් ඉවහල් වේ. කෘෂිකර්මය හා සත්ත්ව පාලනය තුළින් තම විවේක කාලය ඵලදායී ලෙස ගත කිරීමට අවස්ථාව සලසන අතර ආයතනයේ ආහාර අවශ්‍යතා සඳහා ද උපයෝගී කරගනු ලැබේ.

සේවාලාභීන්ගේ සුහදත්වය වර්ධනය කිරීම තුළින් සංස්කෘතික හා කලාත්මක හැකියාවන් දියුණු කිරීමද, රසවින්දනය වඩාත් නිර්මාණශීලීව ඇති කිරීම ද සිදු කරනු ලැබූ අතර, ඒ තුළින් නිර්මාණශීලී පුද්ගලයකු බවට පත් කිරීම ඉහත වැඩසටහන් තුළින් සම්පූර්ණ කර ගැනීමට අපේක්ෂා කරනු ලැබේ.

2015 වර්ෂය තුළ සේවාලාභීන්ගේ විවේක කාලය ඵලදායී ලෙස ගත කිරීමට හා පුනරුත්ථාපනය කිරීමෙන් පසුව තම ජීවන තත්ත්වය වැඩිදියුණු කරගැනීම අරමුණු කොට ගෙන වෘත්තීය පුහුණු පාඨමාලා ආරම්භ කිරීමට සැලසුම් කොට ඇත.

# 4 වන පරිච්ඡේදය
# විදේශ ආධාර ව්‍යාපෘති

**1. KOICA ව්‍යාපෘතිය**

**2013 - 2015 කාල රාමුව තුළ කොරියාවේ KEAD ආයතනය මඟින් ලබා දෙන පුහුණු වැඩසටහන යටතේ නිලධාරීන් 17 දෙනෙකුට කොරියාවේදී පුහුණුව ලබා ගැනීමට හැකි විය.**

**2. දිරිසවිය ව්‍යාපෘතිය**

**ලෝක බැංකු ආධාර යටතේ මන්නාරම, යාපනය, කිලිනොච්චිය, වව්නියාව, මුලතිව්, අනුරාධපුරය, පොළොන්නරුව, පුත්තලම හා ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කරනු ලබන "දිරිසවිය" වැඩසටහනේ ආබාධ සහිත වූවන් සඳහා වන වෘත්තීය පුහුණු ව්‍යාපෘතියේ දක්වා වන ප්‍රගතිය පහත සඳහන් පරිදිය.**

| අනු අංකය | දිස්ත්‍රික්කය | ආයතනය | පාඨමාලාව | කාලය | අභ්‍යාසලාභීන් සංඛ්‍යාව | ගිවිසුම්ගත මුදල රු. | වියදම රු. |
|---|---|---|---|---|---|---|---|
| **01.** | මන්නාරම | ආබාධ සහිත වූවන් සඳහා වන සංවිධානය මන්නාරම(MARDA P) | ඉටිපන්දම් හා හඳුන්කූරු සෑදීම | **6** | **20** | **3,300,900.00** | **1,301,865.00** |
| **02.** | යාපනය | ආබාධ සහිත වූවන් පුනරුත්ථාපනය කිරීමේ සංවිධානය ((AROD) | වූල් වැඩ හා පාපිසි නිෂ්පාදනය | **6** | **20** | **2,651,000.00** | **790,169.00** |
| **03.** | කිලිනොච්චිය | තාක්ෂණ අධ්‍යාපන ආයතනය | ජංගම දුරකථන අළුත්වැඩියාව ඇඳුම් මැසීම | **6** | **20** | **5,413,100.00** | **2,356,549.00** |
| **04.** | වව්නියාව | ආබාධ සහිතවූවන් සඳහා වූ වන්නි පුනරුත්ථාපන සංවිධානය | ලෙදර් නිෂ්පාදන | **6** | **20** | **2,632,300.00** | **526,460.00** |
| | | ආබාධ සහිත වූවන් සඳහා වූ පුනරුත්ථාපන සංවිධානය | පරිගණක චිත්‍රක ශිල්පය ( **Graphic design)** | **6** | **15** | **2,210,835.00** | **773,471.13** |
| **05.** | අනුරාධපුරය | සමාජ සේවා දෙපාර්තමේන්තුව, උතුරු මැද පළාත | ජංගම දුරකථන අලුත්වැඩියාව | **6** | **15** | **5,679,300.00** | **1,135,861.00** |
| | | | පැළ තවාන් | **6** | **15** | | |
| | | | අත්කම් නිර්මාණ | **6** | **15** | | |
| **06.** | පොළොන්නරුව | කඳුරට සමාජ හා ආර්ථික මධ්‍යස්ථානය | අත්කම් නිර්මාණ | **6** | **20** | **2,363,735.00** | **472,747.00** |
| **07.** | මුලතිව් | ප්‍රජා සංවර්ධන සංවිධානය | ඇඳුම් මැසීම | **6** | **15** | **3,841,200.00** | |
| | | | වයරින් කිරීම | **6** | **15** | | |
| **08.** | පුත්තලම | **Child Vision Sri Lanka** | ඇඳුම් මැසීම | **6** | **20** | **5,308,050.00** | **1,061,610.00** |
| | | | ජංගම දුරකථන අළුත්වැඩියාව | **6** | **20** | | |
| **09.** | ත්‍රිකුණාමලය | කින්නියා තාක්ෂණ ආයතනය | ඇඳුම් මැසීම හා අත්කම් නිර්මාණ | **6** | **20** | **2,592,700.00** | **518,540.00** |
| | | | **එකතුව** | | | **35,993,120.00** | **8,937,272.13** |

- "දිරිසවිය වැඩසටහන" ක්‍රියාත්මක කරන තෝරාගත් දිස්ත්‍රික්කවල ආබාධ සහිත වූවන් සඳහා ලබාදෙන රු.3000/- මාසික දීමනාව යටතේ ඒකාබද්ධ අරමුදලට ඉතිරි වන ප්‍රතිපාදන වලින් අමුණුකුඹුර හා තෙළඹුයාය වෘත්තීය පුහුණු ආයතන පුළුල් කිරීමේ නව ඉදිකිරීම් ව්‍යාපෘති ආරම්භ කිරීමට මෙම වසරේ හැකි විය.

- මුළු දිවයිනම ආවරණය වන පරිදි සේවා සපයන්නන්ගේ දැනුම වර්ධනය සඳහා වැඩසටහන් 10 ක් පැවැත්වීට කටයුතු සංවිධානය කර ඇති අතර වැඩසටහන් 04 ක් පවත්වා ඇත. (නිලධාරීන් 147ක් සහභාගි වී ඇත.)

## 2014 වර්ෂයේ විශේෂ වැඩසටහන්

- මෙම දෙපාර්තමේන්තුවේ වෘත්තීය පුහුණු ආයතනවල අභ්‍යාසලාභීන් සඳහා 2014. 04. 24 වන දින පැලවත්ත බුද්ධදාස ක්‍රීඩාංගෙනයේදී බාහිර ආයතනවල මූල්‍ය දායකත්වයෙන් අවුරුදු උත්සවයක් පැවැත්වීම.
- ලෝක සෞඛ්‍ය සංවිධානයේ මූල්‍ය අනුග්‍රහයෙන් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ සියලුම ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා කාර්ය සංවර්ධන වැඩමුළුවක් 2014. 08. 21, 22, 23 තෙදින කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා පස්දුන්රට අධ්‍යාපන පීඨයේදී පවත්වන ලදී. ඒ සඳහා නිලධාරීන් 462දෙනෙකු සහභාගී වූ අතර වියදම රු. 1, 955, 347.00 කි.
- 2014 ආරම්භයේ සිට ජාතික රූපවාහිනී නාලිකාවේ රාත්‍රී 8.00 ප්‍රධාන පුවත් ප්‍රකාශය සංඥා භාෂාවෙන් ඉදිරිපත් කිරීම.

**සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ඇගයුම් සහ මෙහෙයුම් ක්‍රියාවලිය**

- කාර්ය මණ්ඩලය සඳහා දෙසති රැස්වීම - දෙසතියකට වරක්
- සමාජ සුභසාධන අධිකාරිවරුන්/ ස්ථානභාර නිලධාරීන්ගේ රැස්වීම - මාසිකව
- වෘත්තීය පුහුණු ආයතනවල කාර්ය මණ්ඩල රැස්වීම - මාසිකව
- මූලස්ථාන සමාජ සේවා නිලධාරීන්ගේ රැස්වීම - මාසිකව
- පළාත් අධ්‍යක්ෂක වරුන්ගේ රැස්වීම -ත්‍රෛමාසිකව
- පළාත් ලේකම්වරුන්ගේ රැස්වීම - සය මාසිකව

# 5 වන පරිච්ඡේදය

## ආබාධ සහිත පුද්ගලයින් සඳහා වනප්‍රජාමූලික අන්තර්කරණ

## සංවර්ධන ජාතික වැඩ සටහන - C B I D

### අරමුණ

ආබාධ සහිත පුද්ගලයින්ගේ ජාතික ප්‍රතිපත්තියට අනුව ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර එම පුද්ගලයින්ගේ හැකියාවන් හා දක්ෂතාවයන් පවතින සමාජ ආර්ථික ක්‍රමය තුළ ජාතික සංවර්ධනයට දායක කර ඔවුනගේ වගකීම් හා යුතුකම් ඉටු කිරීමට හැකිවන පිණිස ඔවුන් දැනුමෙන් හා කුසලතාවලින් සවිබල ගැන්වීමසහ ඔවුන් සමාජයට ඒකීකරණය පිණිස , දැනට පවත්නා වූ සමාජ සංවර්ධන වැඩසටහන් තුළ අවස්ථා ඇති කිරිම .

### පසුබිම

ආබාධ සහිත පුද්ගලයින්ද, සමාජයේ සම සාමාජිකයින් වන අතර ඔවුන් අයත් ප්‍රජාවන්තුළ ඔවුනට සම අයිතින් ලැබිය යුතු මෙන්ම ඔවුනට අවශ්‍ය වන්නා වූ අනුබලයන් වන පොදු අධ්‍යාපන, සෞඛ්‍ය, රැකීරක්ෂා, ප්‍රවේශ පහසුකම් , සුභසාධන හා වෙනත් ඕනෑම අවශ්‍යතාවයක් පවතින ව්‍යුහයන් තුළින්ම අනෙකුත් අයට හා සමාන ලෙස සැපයිය යුතුය; යන්න ජාත්‍යන්තර වශයෙන් පිළිගත් සම සහජීවනය සඳහා වූ අයිතිවාසිකමයි .

ආබාධ සහිත සියලු පුද්ගලයින් විසින් ඔවුන්ගේ අයිතිවාසිකම් භුක්ති විඳීමට හා වගකීම් ඉටු කිරීමට හැකි වීම පිණිස සංවර්ධනය කිරීම, ඔවුන්ට සම අවස්ථා සලසා දිම හා ඔවුන් සමාජයට ඒකීකරණය කිරීම පිණිස ප්‍රජා සංවර්ධනය තුළ ගැබ්වුන ක්‍රියාවලිය ප්‍රජා මූලික පුනරුත්ථාපනය ලෙස අර්ථ දැක්විය හැක. සෙසු වැඩසටහනේදි ජාතික , පළාත් , දිස්ත්‍රික් ,ප්‍රාදේශිය හා ග්‍රාමීය වශයෙන් විවිධ මට්ටම්වලදි විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු, විවිධ රාජ්‍ය නොවන සංවිධාන හා සම්පත් පුද්ගලයින්ගෙන් සමන්විත මෙහෙයුම් කමිටු ස්ථාපිත කර ඇති අතර, ආබාධ සහිත පුද්ගලයා හා එම පවුල්වල සාමාජිකයින්ගෙන් සැදුම්ලත් ප්‍රාදේශීය හා දිස්ත්‍රික් ස්වශක්ති සංවිධාන පිහිටුවා ඔවුන් බල ගැන්විම කළ යුතුය.

සියලුම අංශ තුළ මානව සම්පත් සංවර්ධනය හා ඝෘණාත්මක ආකල්ප වෙනස් කිරිම සඳහා කටයුතු කළ යුතුය.

### ක්‍රියාකාරකම්

1. ආබාධ සහිත පුද්ගලයින් සහ එම පවුල්වල පුද්ගලයින් දැනුමෙන් ආකල්පවලින් හා ක්‍රියාකාරකම්වලින් සවිබලගැන්වීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
2. නිවාස, සමාජය, පෙරපාසල්, පාසල , විශ්වවිද්‍යාලය, සේවා ස්ථාන තුළ ස්වාධීන පුද්ගලයෙකු ලෙසට කටයුතු කිරීම සඳහා ස්වේච්ඡා සේවකයින් මගින් දෛනික ක්‍රියාකාරකම් පුහුණුව.
3. අන්තර්කරණ අධ්‍යාපන ක්‍රමය තුළ හෝ විශේෂ අධ්‍යාපන ක්‍රමය තුළින් මෙම ආබාධ සහිත දරුවන්ට අධ්‍යාපන අවස්ථා ලැබීම සඳහා යොමු කිරීම ඇතුළු අනෙකුත් සේවාවන් සඳහා යොමු කිරීම.
4. ආර්ථිකය සවිබලගැන්වීම සඳහා කම්කරු අමාත්‍යාංශය හා පෞද්ගලික අංශය සමග ඒකාබද්ධව රැකියා අවස්ථා ලබාදීම හා රැකියාවන් සඳහා පූර්ව සූදානම් කිරීම.
5. ප්‍රාදේශීය මට්ටමේ හෝ ජාතික මට්ටමේ වෘත්තීය පුහුණු ආයතන හරහා වෘත්තීය පුහුණුව ලබාදීමට කටයුතු කිරීම.

6. අනෙකුත් අමාත්‍යාංශ , දෙපාර්තමේන්තුවල පවතින වැඩසටහන්වලට ආබාධ සහිත පුද්ගලයින් අන්තර්කරණය කිරීම. – ( ක්‍රීඩා, සංස්කෘතික වැනි)
7. විවිධ ආගමික, සංස්කෘතික හා සමාජීය වැඩසටහන්වලට සක්‍රීය ලෙස සහභාගී කරවීම.

මේ සඳහා යොදාගනු ලබන ක්‍රම ශිල්ප

- අන්තර් අමාත්‍යාංශ හා රාජ්‍ය නොවන සංවිධානවලින් සැදුම්ලත් ජාතික මෙහෙයුම් කමිටු යාවත්කාලීන කිරීම.
- ජාතික මෙහෙයුම් කමිටුවේදී ගනු ලැබූ තීරණයන්ට අනුව සී.බී.ආර්. වැඩසටහන සඳහා පස් අවුරුදු සැලැස්මක් සකස් කර ඒ අනුව කටයුතු කිරීම.
- සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ ප්‍රධානත්වයෙන් දිස්ත්‍රික් කමිටු පවත්වා ශ්‍රී ලංකාවේ ආබාධිත බව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනුම යාවත්කාලීන කිරීම.
- සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල සේවය කරන සමාජ සේවා නිලධාරීන්, සමාජ සංවර්ධන සහකාරවරුන්, ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් යන නිලධාරීන් සඳහා සියලුම දිස්ත්‍රික් ආවරණය වන පරිදි වාර්තාකරණය හා සටහන් තැබීම පිළිබඳවත් සී.බී.ආර්. වැඩසටහන් නව ප්‍රවනතා පිළිබඳවත් වැඩමුළු පැවැත්වීම.
- ප්රාදේශීය මට්ටමේ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා අන්තර්කරණ වැඩමුළු පැවැත්වීම.
- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ග්‍රාමීය නායකයින් සඳහා වැඩමුළු පැවැත්වීම.
- ආබාධ සහිත පුද්ගලයින්ගෙන් සැදුම්ලත් ස්වශක්ති සංවිධාන පිහිටුවීම හා බලගැන්වීම.
- අබාධ සහිත පුද්ගල දෙමාපිය සංවිධාන පිහිටුවීම හා දැනුවත් කිරීම.
- ස්වේච්ඡා සේවක පුහුණු වැඩමුළු පැවැත්වීම.
- පළාත් සහායක නිලධාරීන් සඳහා ක්ෂේත්‍ර පුහුණු වැඩමුළු හා මාසික ප්‍රගති වාර්තා ලබා ගැනීම හා සමාලෝචනය.
- සංඥා භාෂාව ශ්‍රී ලංකාවේ පිළිගත් භාෂාවක් බැවින්, සංඥා භාෂාව පිළිබඳව නිලධාරීන් සඳහා පුහුණු පාඨමාලා පැවැත්වීම .

| ප්‍රජාමූලික පුනරුත්ථාපනවැඩසටහන -2014<br>භෞතික ප්‍රගතිය | | |
|---|---|---|
| 1. | නිවෙස් මට්ටමේ පුනරුත්ථාපනය | 7163 |
| 2. | සමාජ ගත කිරීම් | 2104 |
| 3. | පෙර පාසැල් වෙත යොමු කළ සංඛ්‍යාව | 583 |
| 4. | සාමාන්‍ය පාසැල් වෙත යොමු කළ සංඛ්‍යාව | 386 |
| 5. | විශේෂ පාසැල් වෙත යොමු කළ සංඛ්‍යාව | 553 |
| 6. | චිකිත්සක සේවා සඳහා යොමු කිරීම් | 3919 |
| 7. | වෘත්තීය පුහුණුව සඳහා යොමු කිරීම් | 1486 |
| 8. | රැකියා සඳහා යොමු කිරීම් | 585 |
| 9. | ස්වයං රැකියා සඳහා යොමු කිරීම් | 2907 |
| 10. | සෘජු ප්‍රතිලාභ ලබා දුන් සංඛ්‍යාව | 115 |
| 11. | ස්වශක්ති කණ්ඩායම් බලගැන්වීම | 780 |

- ප්‍රිඩ්සෝ(FRIDSO) ආයතනයේ අනුග්‍රහයෙන් ප්‍රජා මූලික පුනරුත්ථාපන වැඩසටහන යටතේ,තමන්කඩුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ වසම් 55ක් තුළ අහඹු ලෙස තෝරාගත් පවුල් 16,000 පමණ යොදාගෙන,සේවා අවශ්‍යතා හඳුනාගැනිම හා ඵලදායීසේවාවන් ලබාදිම පිළිබඳව සමීක්ෂණයක් කරන ලදි. මෙම සමීක්ෂණයක් සඳහා නිලධාරින් 100 දෙනෙකු සහභාගී වූ අතර ඒ සඳහා දින 05 කාලයක් ගත විය. අන්තර් ආංශික ප්‍රවේශයක් තුළ සේවාවන් ලබාදීම පිළිබඳ අධ්‍යනය කිරීම මෙම සමීක්ෂණයේ අරමුණ විය.

| අනු අංකය | දිස්ත්‍රික්කය | ක්‍රියාකාරකම් | | | | | | වියදම රු. |
|---|---|---|---|---|---|---|---|---|
| | | සෘජු ප්‍රතිලාභ (කොමඩ්,විදුලිය,රැම්ප් ආදිය) | සංඥා භාෂා පාඨමාලා | ස්වේච්ඡා සේවක බැඳුම් | ත්‍රිකෝණ කණ්ඩායම් නිලධාරීන් සඳහා සී.බී.ආර්. පුහුණු බැඳුම් | ප්‍රජා මූල සංවිධාන දෙමව්පිය ස්වශක්ති සංවිධාන බැඳුම් | ප්‍රාදේශීය මෙහෙයුම් / ග්‍රාමීය මට්ටමේ බැඳුම් | |
| 01. | කොළඹ | 3 | | 24 | 1 | 89 | 55 | 200,000.00 |
| 02. | ගම්පහ | 1 | 1 | 15 | 1 | 69 | 26 | 300,000.00 |
| 03. | කළුතර | 28 | 1 | 126 | 1 | 912 | 627 | 687,500.00 |
| 04. | ගාල්ල | 10 | 1 | 55 | 1 | 221 | 185 | 500,000.00 |
| 05. | මාතර | 5 | 1 | 43 | | 249 | 203 | 400,000.00 |
| 06. | හම්බන්තොට | 18 | | 25 | | 226 | 234 | 400,000.00 |
| 07. | කුරුණෑගල | 2 | | 191 | 1 | 717 | 480 | 200,000.00 |
| 08. | පුත්තලම | 2 | 1 | 126 | 1 | 592 | 392 | 100,000.00 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **09.** | අනුරාධපුරය | **7** | **1** | **92** | **1** | **459** | **466** | **400,000.00** |
| **10.** | බදුල්ල | **13** | | **87** | **1** | **268** | **197** | **400,000.00** |
| **11.** | මොණරාගල | **2** | | **42** | **1** | **206** | **40** | **400,000.00** |
| **12.** | රත්නපුර | **10** | **1** | **56** | **1** | **149** | **174** | **400,000.00** |
| **13.** | කෑගල්ල | **2** | **1** | **58** | **1** | **163** | **264** | **400,000.00** |
| **14.** | මහනුවර | **4** | **1** | **26** | **1** | **417** | **220** | **425,000.00** |
| **15.** | මාතලේ | **9** | **1** | **13** | **1** | **143** | **86** | **400,000.00** |
| **16.** | නුවරඑළිය | | | **2** | **1** | **25** | **6** | **200,000.00** |
| **17.** | පොළොන්නරුව | **1** | **1** | **59** | **1** | **210** | **157** | **350,000.00** |
| **18.** | මඩකළපුව | | | **62** | **1** | **438** | | **250,000.00** |
| **19.** | අම්පාර | | | **59** | **1** | **351** | **133** | **200,000.00** |
| **20.** | ත්රිකුණාමලය | | | **8** | | **73** | **21** | **100,000.00** |
| **21.** | යාපනය | | | **4** | | **101** | **90** | **300,000.00** |
| **22.** | මන්නාරම | | | **13** | **3** | **15** | **12** | **200,000.00** |
| **23.** | මුලතිව් | | | **9** | **3** | **19** | **21** | **200,000.00** |
| **24.** | කිලිනොච්චි | | | **16** | | **59** | | **200,000.00** |
| **25.** | වවුනියා | | | **2** | | **4** | **3** | **200,000.00** |
| එකතුව | | | | | | | | **7,812,500.00** |

## 6 වන පරිච්ඡේදය

## 2014 වර්ෂයේ පුහුණු වැඩසටහන්හාපුහුණුපාඨමාලා

| පවත්වන ලදපුහුණුවැඩසටහන්/ පුහුණු පාඨමාලා | දිනය හා ස්ථානය | සහභාගී වූ සංඛ්‍යාව | ප්‍රතිපාදන රු. මි. | වියදම රු. මි. |
|---|---|---|---|---|
| **1.** වෘත්තීය පුහුණු ආයතනවල ධාරිතා සංවර්ධන වැඩසටහන | **2014-01-06/07** ඌව කළමණාකරණ පුහුණු මධ්‍යස්ථානය - පස්සර | **75** | **2.727** | **2.726** |
| **2.** උතුරු මැද පළාත් රැස්වීම | **2014-01-21** පළාත් සමාජ සේවා අමාත්‍යාංශ ශ්‍රවනාගාරය | **65** | | |
| **3.** මධ්‍යම පළාත් රැස්වීම | **2014-01-23** කැටවල වෘත්තීය පුහුණු ආයතනය | **120** | | |
| **4.** දකුණු පළාත් රැස්වීම | **2014-01-24** වැලිගම ප්‍රා.ලේ.කා. ශ්‍රවනාගාරය | **180** | | |
| **5.** සොබාදහමේ චිකිත්සක වැඩමුළුව | **2014-02-12**මාදිවෙල සංස්කෘතික මධ්‍යස්ථානය | **150** | | |
| **6.** වෘත්තීය පුහුණු ආයතනවල නිලධාරීන් මුදල් රෙගුලාසි පිළිබඳව දැනුවත් කිරීමේ වැඩමුළුව | **2014-02-13** සමාජ සේවා දෙපාර්තමේන්තුව | **40** | | |
| **7.** ඌව පළාත් රැස්වීම | **2014-02-20** ඌව පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශ ශ්‍රවනාගාරය | **100** | | |
| **8.** දැයට කිරුළ ප්‍රදර්ශනයට සමගාමීව පෙර පාසල් ගුරු පුහුණු පාඨමාලාව (6 මාසික) න්‍යායාත්මක පුහුණුව | **2014-02-22/ 23/ 24** ග්‍රාම සංවර්ධන මධ්‍යස්ථානය බඩගමුව, කුරුණෑගල | **29** | | |
| **9.** අපේ සොඳුරු පවුල වැඩසටහන | ලුණුගම්වෙහෙර ප්‍රා.ලේ. කාර්යාලය **2014-02-22/23** | **60** | | |
| **10.** සංවර්ධන නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ එක් දින වැඩමුළුව | **2014-02-28** තලාහේන ප්‍රජා ආයතනය | **135** | | |

| | | | | |
|---|---|---|---|---|
| **11.** සබරගමුව පළාත් රැස්වීම | **2014-03-07** කච්චේරි සංකීර්ණය, රත්නපුරය | **100** | | |
| **12.** නැගෙනහිර පළාත් රැස්වීම | **2014-03-14** ප්‍රාදේශීය සභාව, ත්‍රිකුණාමලය | **115** | | |
| **13.** බස්නාහිර පළාත් රැස්වීම | **2014-03-17** කොළඹ දි.ලේ.කාර්යාලය | **150** | | |
| **14.** විශේෂ අවශ්‍යතා ඇති ළමුන් සඳහා අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ පෙර පාසල් ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩමුළුව | **2014-04-04/05** කොළොන්නාව ප්‍රා.ලේ. කාර්යාලය | **120** | | |
| **15.** වෘත්තීය උපදේශකවරුන්ගේ කාර්යභාරය පිළිබඳ දෙදින වැඩමුළුව | **2014-04-07/08** සමාජ සේවා දෙපාර්තමේන්තුව | **55** | | |
| **16.**සංඥා භාෂා වැඩමුළුව | **2014-05-09/10/23/24/30/31 2014-06-06/07** සමාජ සේවා දෙපාර්තමේන්තුව | **13** | | |
| **17.**කොරියානු අධ්‍යයන චාරිකාව | **2014- 07- 06** සිට **19** **2014- 09- 28** සිට **10 - 28** | **16** | | |
| **18.** පවුල් ප්‍රතිපත්තිය සැකසීම පිළිබඳ වැඩමුළුව | **2014.08.29** සමාජ සේවා දෙපාර්තමේන්තුව | **14** | | |
| **19.** බස්නාහිර පළාත් ප්‍රගති සමාලෝචන රැස්වීම | **2014.09.02** සමාජ සේවා දෙපාර්තමේන්තුව | **37** | | |
| **20.**උපස්ථායකවරුන් සඳහා එක්දින වැඩමුළුව | **2014.12. 29** සමාජ සේවා දෙපාර්තමේන්තුව | **22** | | |
| **21.** සිංහල භාෂා පුහුණුව | රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව (මාස 06) | **01** | | |
| **22.** වාහන කළමනාකරණ පුහුණුව | ICTAD ආයතනය (දින 05) | **01** | | |
| **23.**පරිගණක ඩිප්ලෝමා පුහුණුව | SLIDA ආයතනය (මාස 06) | **01** | | |